



# පුස්තකාල ප්‍රවෘත්ති
# நூலகச் செய்திகள்
# LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்

The Newsletter of the National Library of Sri Lanka

23 වෙළුම 1 කලාපය
2002 ජනවාරි - මාර්තු
மலர் 23 இதழ் 1
2002 ஜனவரி - மார்ச்
Vol. 23 No.1
January - March 2002
ISSN 1391 - 0000



කියවීමේ රුචිය වර්ධනය කිරීමේ වැඩසටහන හා පොත්
ප්‍රදර්ශනය විවෘත කිරීමේ සමාරම්භක උත්සවය
வாசிப்புப் பழக்கத்தை ஊக்குவிக்கும் விழா மற்றும்
நூற் கண்காட்சித் திறப்பு விழா
Inauguration of Reading Habit Promotion Programme
and Book Exhibition 26.02.2002



පාසල් ළමයින් තුළ කියවීමේ රුචිය වර්ධනය කිරීම
பாடசாலை மாணவர்களிடையே வாசிப்புப் பழக்கத்தை
ஊக்குவிக்கும் செயற்திட்டம்
Promotion of Reading Habit among School Children
20.02.2002

82720
23/09/02




# පුස්තකාල ප්‍රවෘත්ති

## LIBRARY NEWS நூலகச் செய்திகள்

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் செய்திப் பிரசுரம்

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRILANKA

ආරම්භය 1973 - Established 1973 - ஆரம்பம் 1973



23 වන වෙළුම 1 කලාපය
2002 ජනවාරි - මාර්තු

සංස්කාරක උපදේශක මණ්ඩලය
එම්. එස්. යූ අමරසිරි
අධ්‍යක්ෂ ජනරාල්

ඩබ්ලිව්.එස්.පුණ්‍යවර්ධන
නියෝජ්‍ය අධ්‍යක්ෂ

සංස්කාරක මණ්ඩලය
වරුණි ගඟබඩආරච්චි, පද්මා බණ්ඩාරනායක, උදිත අලහකෝන්, සුජීව හීන්කෙන්ද

සහාය සංස්කාරක
එච්. ඒ. කේ. ප්‍රේමරත්න

පරිගණක අක්ෂර සංයෝජනය
පී.එස්.කේ.ලියනගේ
සෙන්තිල් වානි

මුද්‍රණය හා ප්‍රකාශනය
ප්‍රකාශන අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
නිදහස් මාවත, කොළඹ 07
ශ්‍රී ලංකාව

දුරකථනය : 674387, 698847- 260
ෆැක්ස් : 94- 1 - 685201

ඊ මේල් : pub@mail.natlib.lk

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2002

කලාපයක මිල රුපියල් 25.00 $ 2.50
වසරක දායක මුදල රුපියල් 100.00
චෙක්පත් හා මුදල් ඇණවුම්පත්
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
නමට යොමුකරන්න

පිටකවරය මුද්‍රණය
සමයවර්ධන ප්‍රින්ටර්ස්



மலர் 22 இதழ் 4
ஒக்ரோபர் - டிசெம்பர் 2001

பதிப்பாசிரியர் ஆலோசனைக்குழு
எம்.எஸ்.யு. அமரசிறி
பணிப்பாளர் நாயகம்

டபிள்யு.எஸ்.புண்ணியவர்தன
உதவிப் பணிப்பாளர்

பதிப்பாசிரியர் குழு
வருணி கங்கபடஆராச்சி, பத்மா பண்டாரநாயக்க, உதித்த அழகக்கோன், சுஜீவ கீங்கெந்த

எச்.ஏ.கே. பிரேமரத்ன
உதவிப் பதிப்பாசிரியர்

கணினி வடிவம்
பீ.எஸ்.கே. லியனகே
சி. செந்தில்வாணி

அச்சிட்டு வெளியிடல்
வெளியீட்டுப் பிரிவு
தேசிய, நூலக ஆவணவாக்கல் சேவைகள் சபை,
சுதந்திர வழி, கொழும்பு 07
இலங்கை.

தொலைபேசி 674387, 698847- 260
பெக்ஸ் 94-1-685201
ஈ மெயில் pub@mail.natlib.lk

© தேசிய, நூலக ஆவணவாக்கல் சேவைகள் சபை 2001
பிரதியின் விலை ரூபா -25.00 $2.50
ஆண்டுச் சந்தா ரூபா. 100.00
சகல காசோலைகளும், தபால் கட்டளைகளும்

தலைவர்
தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் பெயருக்கு எழுதப்பட வேண்டும்.

வெளிஅட்டை அச்சிடல்
சமயவர்த்தன பிரிண்டர்ஸ்



Volume 23 No. 1
January - March 2002

Editorial Advisory Board
M.S.U. Amarasiri
Director General

W.S.Punyawardena
Deputy Director

Editororial Board
Varuni Gangabadaarachchi, Padma Bandaranaike, Uditha Alahakoon, Sujeeva Heenkenda

Asst. Editor
H.A.K. Premaratna

Computer Typesetting
P.S.K. Liyanage
SenthilVani

Printed & Published by
Publication Division
National Library & Documentation Services Board,
Independence Avenue, Colombo 07.
Sri Lanka.

Tel. 674387 - 698847 - 260
Fax: 94 -1 - 685201
e mail : pub@mail.natlib.lk

©National Library and Documentation Services Board 2002
Price per Copy Rs. 25.00 ɔ 2.50
Annual Subscription Rs.100
All Cheques and Money Orders should be forwarded to

Chairman
National Library & Documentation Services Board

Cover Printed by
Samayawardhana Printers


BL 82720
23 SEP 2002
NATIONAL LIBRARY AND DOCUMENTATION CENTRE

## පටුන

| | |
|---|---|
| කතුවැකිය | 03 |
| ජාතික පුස්තකාල පුවත් | 04-05 |
| වෙනත් පුස්තකාල පුවත් | 06-08 |
| தேசிய நூலகச் செய்திகள் | 09-10 |
| பிற நூலகச் செய்திகள் | 11-13 |
| National Library News | 14 |
| Other Library News | 15-17 |
| 21 වන සියවසට ඩිවි දශම වර්ගීකරණයේ සාපේක්ෂ වැදගත්කම<br>ඩබ්.එම්.ඒ.කේ.විජේකෝන් | 19-24 |
| **Library & Information Education of Sri Lanka in comparison with those of other South Asian countries**<br>Pradeepa Wijetunga | 25-30 |

කතුවැකිය

# ආර්ථික අර්බුදය සහ පුස්තකාල සේවාව

අද්‍යතන ශ්‍රී ලාංකීය සමාජය මුහුණ දී සිටින ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස පුස්තකාලවලට අවශ්‍ය දැනුම් ද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය බරපතල ගැටලුවක් බවට පත් වී ඇත. එහෙයින් පාඨක අවශ්‍යතා සපුරාලීම සම්බන්ධයෙන් පුස්තකාල පැමිණ සිටිනුයේ අභියෝගාත්මක කඩඉමකටය. ප්‍රමාණවත් සම්පත් නොමැතිව පුස්තකාල් පාඨකයන්ගේ අනේකවිධ අවශ්‍යතා සපුරාලීම අතිශයින් දුෂ්කර කර්තව්‍යයකි. විශේෂයෙන් ශ්‍රී ලාංකික පුස්තකාල අති බහුතරයක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මත යැපීම ඊට ප්‍රධාන වශයෙන් ම හේතු පාදක වී තිබේ. එම නිසා පොදුවේ රට මුහුණ දී ඇති ආර්ථික අර්බුදය හමුවේ හුදෙක් රාජ්‍ය මූල්‍ය දෙස මුව අයා බලා සිටීමේ සංකල්පය පසෙක ලා මුදල් ඉපයීමේ සහ සම්පත් අත්පත් කර ගැනීමේ නව මං සෙවීමට පුස්තකාලවලට සිදු වේ. මෙය එක් පුස්තකාලයකට තනිව කළ හැකි කාර්යයක් නොවේ. එවැනි කේවල සහ හුදෙකලා ප්‍රයත්න සමස්තයක් වශයෙන් ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට බලපෑමක් එල්ල කරනුයේ මඳ වශයෙනි. මෙම අර්බුදය ජයගත හැක්කේ පුස්තකාල හා පුස්තකාල වෘත්තිකයන් විසින් ගනු ලබන දැනුවත්, සාමූහික උත්සාහයන් මගින් පමණි.

ජාතික සංවර්ධනයේ දී තොරතුරුවල අගය මනාව වටහා ගත් රටවල් 'ජාතික තොරතුරු ප්‍රතිපත්තියක්' ගොඩ නැංවීමට උත්සුක වන යුගයක ඊට සුවිශේෂ දායකත්වයක් සපයන පුස්තකාලවල කාර්ය භාරය අඩුවෙන් තක්සේරු කිරීම එතරම් හිතකර තත්ත්වයක් ලෙස සැලකිය නොහැකිය. පුස්තකාල ක්ෂේත්‍රයේ පිරිවැය අවම කරන සාමූහික සහ සහයෝගිතා වැඩසටහන්වල අවශ්‍යතාව සහ වටිනාකම වඩාත් දැනෙනුයේ මෙවන් වටපිටාවක් මධ්‍යයේ ය. සාමූහික ප්‍රතිග්‍රහණය, සාමූහික සූචිකරණය, සාමූහික ගබඩාකරණය, අන්තර්පුස්තකාල පිරුළු, සාමූහික පුහුණුව සහ තොරතුරු තාක්ෂණයේ මහිමයෙන් දුරස්ථ දත්ත පදනම් වෙත ප්‍රවේශය යනා දී ක්‍රියාකාරකම් කෙරෙහි පුස්තකාල වෘත්තිකයන්ගේ අවධානය යොමු වීම යුගයේ අවශ්‍යතාවකි. එසේ නොවී තවදුරටත් 'රොබින්සන් කෲසෝ' ආකෘතියෙහි ම ඇලී ගැලී සිටියහොත් පුස්තකාල මෙන් ම පුස්තකාල වෘත්තිකයන් ද 'පරිසරයට අනුවර්තනය නොවන ජීවීන් වඳ වේ' යන ප්‍රකට ඩාවින්වාදී නියාමයට ගොදුරු වී මිහිතලයේ අසරණයන් බවට පත් වනු නිසැකය.

දැනුම මූලික සමාජයක්, දැනුම් ආර්ථිකයක් සහ තොරතුරු සමාජයක් පිළිබඳව නිරන්තර සම්භාෂණ පවත්නා වකවානුවක ඊට අදාළ සම්පත් ගබඩා කර සංවිධානය කර බෙදාහරින මධ්‍යස්ථාන වන පුස්තකාලවල වගකීම සහ කාර්යභාරය අන් කවරදාටත් වඩා ඉහළ යමින් පවතී. එහෙයින් ආර්ථික අර්බුද හමුවේ උදාසීනත්වයට පත් නොවී මූල්‍ය සහ භෞතික සම්පත් ගවේෂණයේ විකල්ප හා නව මං හෙළි පෙහෙළි කර ගනිමින් ස්වශක්තියෙන් නැගී සිටීමට පුස්තකාල උත්සාහ කළ යුතුය. ප්‍රජාතන්ත්‍රීය සමාජයක් ගොඩ නැංවීමේ ක්‍රියාවලිය තුළ පුරවැසියන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලන, සමාජයේ කැපී පෙනෙන ආයතනයක් බවට පුස්තකාල පරිවර්තනය කළ හැක්කේ නිර්මාණශීලී ගුණයෙන් පිරිපුන් පුස්තකාල වෘත්තිකයන්ගේ සාමූහික ප්‍රයත්න මගින් පමණකැයි යන්න පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සියල්ලන් විසින් පසක් කර ගතයුතු යථාර්ථයකි.

සංස්කාරක මණ්ඩලය

# ජාතික පුස්තකාල පුවත්

## වැඩමුළු

බස්නාහිර පළාතේ ජාතික පාසල්/අධ්‍යාපන විද්‍යා පීඨ/ගුරු විද්‍යාල පුස්තකාලයාධිපතින් සඳහා 2002.02.13 සහ 14 යන දෙදින තුළ 'පාසල් පුස්තකාල සංවර්ධනය සහ නවීකරණය' යන මාතෘකාව යටතේ වැඩමුළුවක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. එයට පාඨමාලාලාභීන් 51 දෙනෙක් සහභාගි විය.


## සම්මන්ත්‍රණ

ජාතික පාසල්/ගුරු විද්‍යාල/අධ්‍යාපන විද්‍යා පීඨ පුස්තකාලයාධිපතින් සඳහා එක්දින සම්මන්ත්‍රණයක් 2002.03.01 දින ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී පැවැත්විණි. මෙ සඳහා පාඨමාලාලාභීන් 54 දෙනෙකු සහභාගි විය.

උතුරු නැගෙනහිර පළාතේ කළමනාකරණ අභිවෘද්ධි හා පුහුණු දෙපාර්තමේන්තුව සංවිධානය කළ මහජන පුස්තකාලයාධිපතීන් සඳහා ප්‍රගති සමාලෝචන සම්මන්ත්‍රණයක් 2002.03.11 දින ත්‍රිකුණාමලය නගර ශාලාවේ දී පවත්වන ලදී. මේ සඳහා සිංහල මාධ්‍ය පුස්තකාලයාධිපතීන් 08 දෙනෙකු ද, දෙමළ මාධ්‍ය පුස්තකාලයාධිපතීන් 34 දෙනෙකු ද සහභාගි විය.

## පුහුණු පාඨමාලා

නැගෙනහිර පළාතේ පාසල් පුස්තකාලයාධිපතීන් සඳහා සිව්දින පුහුණු පාඨමාලාවක් 2002.03.07 සිට 10 දින දක්වා ත්‍රිකුණාමලය අග්බෝපුර මානව සම්පත් පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. උතුරු නැගෙනහිර පළාතේ කළමනාකරණ අභිවෘද්ධි හා පුහුණු දෙපාර්තමේන්තුව සමග එක්ව සංවිධානය කළ මෙම පුහුණු පාඨමාලාවට සිංහල මාධ්‍ය පුස්තකාලයාධිපතීන් 34ක් සහ දෙමළ මාධ්‍ය පුස්තකාලයාධිපතීන් 80 දෙනෙකු සහභාගි විය.



## ජාතික පුස්තකාල දේශන

2002 මුල් කාර්තුව තුළ පවත්වන ලද ජාතික පුස්තකාල දේශන පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දේශක | දේශනය |
|---|---|
| වෛද්‍ය ප්‍රියංග ද සොයිසා 2002.01.23 | නොනිමි සමත්කම් මතුකර ලීම |
| මොහාන් සමරනායක මහතා 2002.02.20 | ගැටුම් නිරාකරණය පිළිබඳ ජාත්‍යන්තර අත්දැකීම් |
| ආචාර්ය කේ.ඩී.ජී.විමලරත්න 2002.03.26 | Towards a National Identity through the Costumes of Sri Lanka |

## අන්තර් පුස්තකාල පිරුළු සේවා

2002 ජනවාරි - මාර්තු කාලය තුළ අන්තර් පුස්තකාල පිරුළු සේවා යටතේ පුස්තකාල සංගමය, ජාතික විද්‍යා පදනම, ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු හා සංවර්ධන මධ්‍යස්ථානය, රුහුණු විශ්ව විද්‍යාලය, සබරගමුව විශ්ව විද්‍යාලය හා මොරටුව විශ්ව විද්‍යාලයට පොත් සහ වාර සඟරා ලබා දෙන ලදී.

## පොත් ප්‍රදර්ශන



2002 පෙබරවාරි 26 සිට මාර්තු 03 දින දක්වා කියවීමේ රුචිය වර්ධනය කිරීමේ වැඩ සටහන වෙනුවෙන් පොත් ප්‍රදර්ශනයක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී පැවැත්විණි.

## කියවීමේ රුචිය වර්ධනය කිරීමේ වැඩ සටහන



2002.02.20 දින සිට 2002.03.03 දක්වා සති 02ක කාලයක් තුළ කියවීමේ රුචිය වර්ධනය කිරීමේ වැඩ සටහනක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩ සටහන යටතේ පාසැල් 04ක කියවීමේ රුචිය වර්ධනය කිරීමේ වැඩ සටහන් දියත් කරනු ලැබූ අතර මීට බොරැල්ල සී.ඩබ්.ඩබ්.කන්නන්ගර විද්‍යාලය, නාරාහේන්පිට ඩඩ්ලි සේනානායක විද්‍යාලය, පාමංකඩ දෙමළ විද්‍යාලය හා මාලිගාවත්ත දාරුසලාම් විද්‍යාලය යන විදුහල් තෝරා ගැනුණි.

මීට අමතරව 2002.02.26 සිට 2002.03.03 දක්වා පොත් ප්‍රදර්ශනයක් හා අළෙවිසැලක් ජාතික පුස්තකාල ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී පවත්වනු ලැබූ අතර මෙම සමාරම්භක උත්සවයට ගරු මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මහතා සහභාගි වූ අතර ඉහත සඳහන් විදුහල්වලට පොත් පරිත්‍යාග ද ලබා දෙන ලදී.

## උතුරු නැගෙනහිර ප්‍රදේශයේ පාසල් හා පිරිවෙන්වලට පොත් ආධාර

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලීය වෘත්තීය සංගම් ප්‍රමුඛ සුබසාධක සංගමය එක්ව පිහිටුවා ඇති ඒකාබද්ධ සංගමය මගින් මණ්ඩලයේ ද අනුග්‍රහය මත රජයේ දින සියයේ වැඩ සටහන හා සාම වැඩ පිළිවෙලට සමගාමීව සංවිධානය කරනු ලැබූ නැගෙනහිර ප්‍රදේශයේ දිළිඳු පාසල් සඳහා පොත් පරිත්‍යාග කිරීම 2002.02.27 හා 28 යන දෙදින තුළ දී සිදු කරන ලදී.

සිංහල පාසල් 05ක්, දෙමළ පාසල් 03ක් හා පිරිවෙන් 02ක් සඳහා රු. 64500/= ක් වටිනා මුද්‍රිත පොත් ද, රු. 18000/= ක් වටිනා අභ්‍යාස පොත් ද මෙම පුස්තකාල වෙත බෙදා දෙනු ලැබූ අතර අවසානයේ කියවීමේ රුචිය පිළිබඳව දේශනයක් ද එම විද්‍යාලවල දී පවත්වන ලදී. ඇඳුම් තොගයක් ද ප්‍රදේශවාසීන් වෙත බෙදා දීම සඳහා සේරුවිල විහාරාධිපති ස්වාමීන් වහන්සේ වෙත ප්‍රදානය කරනු ලැබිණි.

## පොත් පරිත්‍යාග

2002 ජනවාරි - මාර්තු කාලය තුළ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් පාසල් පුස්තකාල 61ක්, මහජන පුස්තකාල 65ක්, පිරිවෙන් පුස්තකාල 62ක් හා වෙනත් පුස්තකාල 27ක් සඳහා රු. 450568.80 වටිනා පොත් පරිත්‍යාග කර ඇත.

## විවිධ සම්මන්ත්‍රණ

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ රජයේ පුස්තකාලයාධිපති කණ්ඩායම හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අධ්‍යාපන අංශය අනුග්‍රහයෙන් "සම්පත් කළමනාකරණය -පුස්තකාලයාධිපතිවරුන් කළමනාකරුවන් ලෙස" යන තේමාව යටතේ 2002.02.21 දින සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

## අන්තර්ජාතික ප්‍රමිති අංක

2002 ජනවාරි - මාර්තු මාසවල නිකුත් කරන ලද අන්තර්ජාතික ප්‍රමිති අංක පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISBN) | - 779 |
| අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISSN) | - 18 |
| අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISMN) | - 04 |

## ප්‍රකාශනගත සූචිකරණ දත්ත (CIP)

2002 මුල් කාර්තුව තුළ ග්‍රන්ථ 107ක් සඳහා ප්‍රකාශනගත සූචිකරණ දත්ත නිකුත් කර ඇත.

# වෙනත් පුස්තකාල පුවත්

## මහනුවර ඩී.එස්. සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලය

1841 දී මධ්‍ය නාගරික පුස්තකාලය නමින් මහනුවර ආරම්භ වූ ග්‍රාහක පුස්තකාලය 1920 වන තෙක් දායක මුදල් ගෙවූ ඉංග්‍රීසි උගත් දේශීය හා විදේශීය පාඨකයන් උදෙසා පවත්වාගෙන ගොස් ඇත. ආර්ථික හේතූන් නිසා මෙම පුස්තකාලය පවත්වාගෙන යාමට අපොහොසත් වූ පසු 1920 දී මහනුවර මහ නගර සභාවට මෙම පුස්තකාලය පවරා දී ඇත. දිවයිනේ ප්‍රථමයෙන් ම ආරම්භ වූ මහජන පුස්තකාලය ලෙසින් මෙම පුස්තකාලය ඓතිහාසික වශයෙන් වැදගත් කමක් උසුලනු ලබයි.

මුලින් ත්‍රිකුණාමල වීදියේ (දැනට ඩී.එස්. සේනානායක වීදිය) පවත්වාගෙන ගිය මෙම මහජන පුස්තකාලය 1962 ඔක්තෝබර් මස 20 වන දින වත්මන් ගොඩනැගිල්ලට ගෙන යන ලදී. මෙම ගොඩනැගිල්ල 1950.12.23 දින ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය මහාමාත්‍ය ඩී.එස්.සේනානායක මැතිඳුන් විසින් මුල්ගල තබන ලදුව එතුමා අනුස්මරණය කිරීම සඳහා ඩී.එස්.සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලය නමින් නම් කෙරිණි.

දැනට වසර 80කට ආසන්න කලක් මහනුවර ප්‍රදේශයට පමණක් නොව දිවයිනේ දස දෙසින් පැමිණෙන පාඨක ප්‍රජාවට අවශ්‍ය දැනුම, තොරතුරු සපයමින් මහඟු සේවාවක් සලසන මෙම පුස්තකාලයේ සේවාවන් සඳහා තවදුරටත් ඉඩ පහසුකම් සලසමින් අභිනවයෙන් ඉදිකරණු ලැබූ ගොඩනැගිල්ල 2002 ජනවාරි මස 19 වන දින ස්වදේශ කටයුතු පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ගරු ඇලික් අලුවිහාරේ මැතිතුමා විසින් විවෘත කරනු ලැබීය.


මෙම නව ගොඩනැගිලි සංකීර්ණයේ තවදුරටත් පාඨක ප්‍රජාවට පහසුකම් සලසනු වස් අංග සම්පූර්ණ නව තොරතුරු තාක්ෂණ සේවා අංශයක් පවත්වාගෙන යාමට සැලසුම් කර ඇති අතර, තදබදයකින් යුතුව පවත්වාගෙන ගිය බැහැරදෙන හා විමර්ශන අංශය වඩාත් ඉඩකඩ සහිතව පුළුල් කිරීමටත් කටයුතු කර ඇත.

## පුස්තකාල ගොඩනැගිලි

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙල අනුව එක් අධ්‍යාපන කලාපයකට පුස්තකාල 10ක් ලබා දීමේ වැඩසටහන යටතේ ආසියානු සංවර්ධන බැංකු ආධාර මත රුපියල් ලක්ෂ 06ක මුදලින් ඉදිකළ මහඉලුප්පල්ලම කැලේ දිවුල්වැව විදුහලේ පුස්තකාල ගොඩනැගිල්ල ඉකුත් දින උතුරු මැද ප්‍රධාන ඇමති බර්ටි ප්‍රේමලාල් දිසානායක මහතා අතින් විවෘත කෙරුණි.

## පුස්තකාල ඉතිහාසය කෘතිය දොරට වඩී

පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන ඩබ්.කේ.එම්.එම්.කේ.විරසිංහ මහතා විසින් රචිත පුස්තකාල ඉතිහාසය ග්‍රන්ථය දොරට වැඩීමේ උත්සවය පසුගිය දා කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ දී පවත්වන ලදී. මෙම උත්සවයට සමාජීය විද්‍යා පීඨාධිපති දයානන්ද අමරසේකර, මහාචාර්ය ඩබ්.බී.දොරකුඹුර ඇතුළු ආරාධිතයන් රැසක් සහභාගි වූ අතර ප්‍රධාන ආරාධිත දේශනය පවත්වන ලද්දේ එඩ්වින් ආරියදාස සූරීන් විසිනි.




එම උත්සවයේ දී ඩබ්.කේ.එම්.එම්.කේ.වීරසිංහ මහතා ග්‍රන්ථයේ මුල් පිටපතක් සමාජීය විද්‍යා පීඨාධිපති දයානන්ද අමරසේකර මහතාට පිළිගැන්වූ අවස්ථාව.

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාලය

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාලය හා රැකියා නියමු තොරතුරු මධ්‍යස්ථානය 2002.02.22 දින නැවත විවෘත කරන ලදී. විද්වත් වෘත්තිකයන්ගේ සංගමයේ ආචාර්ය එම්.ගොපලාසුන්දරම් මහතා විසින් පුස්තකාලය විවෘත කරන ලදී.

## විජේවර්ධන අනුස්මරණ මාධ්‍ය පුස්තකාලය

විසිවන සියවස තුළ සිදු වූ වැදගත් සිදුවීම්, තොරතුරු ඓතිහාසික වාර්තා සියල්ල ම පාහේ එක් තැන් කළ ප්‍රලේඛන මධ්‍යස්ථානය දැන් පර්යේෂකයන්, විද්වතුන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා වෘත්තීය මාධ්‍යවේදීන් සඳහා විවෘත කර තිබේ. මෙම ප්‍රලේඛන එකතුවට

- 1940 දශකයේ සිට සම්භාව්‍ය පුද්ගලයන් ගේ චරිතාපදාන හා ලේඛකයන්ගේ ලිපි හා රචනා 33,000ක ලිපි ගොනු ද,
- 1832 සිට පුවත්පත් හා වාර ප්‍රකාශන ද
- දේශපාලනය, ඉතිහාසය, විවිධ සිදුවීම්, සංස්කෘතික හා සමාජමය සිදුවීම් ඇතුළත් විෂයන් රැසකට අයත් ලේඛන ගොනු 5500 ද
- නිදහසෙන් පසු පළ වූ ඡායාරූප අති මහත් රාශියක් ද පිටපත් ලබා ගැනීමේ පහසුකම් ද ඇතුළත් වෙයි.
- සා.පෙ. හා උ.පෙ. සිසුනට ව්‍යාපෘති සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ පහසුකම් ඇත.

සතියේ දිනවල ප්‍රසිද්ධ නිවාඩු දින හා වෙළඳ නිවාඩු දින හැර සඳුදා සිට සිකුරාදා දක්වා උදේ 9 සිට සවස 4 දක්වා විවෘතයි.

විස්තර සඳහා විමසන්න,

පුස්තකාලයාධිපති
දුරකථන 429429 දිගුව 491
විජේවර්ධන අනුස්මරණ මාධ්‍ය පුස්තකාලය සහ
ප්‍රලේඛන මධ්‍යස්ථානය
ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
ලේක්හවුස්, කොළඹ.

## කොළඹ විශ්ව විද්‍යාලීය පුස්තකාලය

කොළඹ විශ්ව විද්‍යාලය හා ජයිකා ඒකාබද්ධ අධ්‍යයන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්මාන කීපයක පුස්තකාලයාධිපතිවරුන් සඳහා පුස්තකාල සංවර්ධන පුහුණු වැඩ සටහනක් 2002.03.08 සහ 09 යන දිනයන් හී දී පවත්වා ඇත.

## මොරටුව විශ්ව විද්‍යාලීය පුස්තකාලය

මොරටුව විශ්ව විද්‍යාලීය පුස්තකාලය "Libsys" මෘදුකාංගය භාවිත කර එහි සියලුම කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම 2001.11.16 සිට ආරම්භ කර ඇත. එහිදී ප්‍රංශ තානාපති කාර්යාලයේ සංස්කෘතික උපදේශක H.E.Jacques Charrier ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වූ අතර විශ්ව විද්‍යාල කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය බී.ආර්.එන්. මෙන්ඩිස් සම්භාවනීය අමුත්තා ලෙස සහභාගි විය.

මෙම මෘදුකාංගය භාවිත කිරීමෙන් සිසුන් හා විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලය මෙන් ම පුස්තකාල කාර්ය මණ්ඩලයට ද පුස්තකාල සූචි සඳහා පහසු වේගවත් ප්‍රවේශයක් ලබා දේ. එමෙන් ම ප්‍රතිග්‍රහණය, සූචිකරණය, පොත් සංසරණය හා වාර සඟරා පාලනය වැනි සියලුම කාර්යයන් ස්වයංක්‍රීයකරණය කර ඇත.


## Arjee's Sri Lanka Web Index (A profile of Sri Lankan Web Sites)

අන්තර්ජාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ හා ආශ්‍රිත තොරතුරු දිනෙන් දින ම වැඩි වී තිබේ. එම තොරතුරු අළලා ශ්‍රී ලංකාව පිළිබඳ වෙබ් අඩවි විවිධ විෂයන් යටතේ ගොනු කර අනුක්‍රමණිකාවක් මොරටුව විශ්ව විද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපති රුවන් ගමගේ මහතා විසින් සම්පාදනය කර ඇත. ශ්‍රී ලංකාව සම්බන්ධ වෙබ් අඩවි 907ක් දැනට එහි ඇති අතර පහත දැක්වෙන විෂයයන් 7ක් යටතේ පෙළ ගස්වා තිබේ.

- අධ්‍යාපනය
- වානිජ්‍ය හා වෙළඳ ක්ෂේත්‍රය
- ආගම හා සමාජය
- පරිගණක හා අන්තර්ජාලය
- දේශපාලනය හා රජය
- පුවත් හා මාධ්‍ය සංචාරක ව්‍යාපාරය
- විද්‍යා හා තාක්ෂණ

## ජාතික අධ්‍යාපන ආයතන පුස්තකාලය

◆ ජාතික අධ්‍යාපන ආයතනයේ මාධ්‍ය අංශය විසින් පාසල් ශරීර සුවතා වැඩ සටහන ක්‍රියාත්මක කරලීම සඳහා ශ්‍රව්‍ය කැසට්පට 10000ක ද වීඩියෝ පට 2000ක් ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත භාර දී ඇත. මෙම වැඩ පිළිවෙල දිවයිනේ සෑම පාසලක ම ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති අතර ඒ පිළිබඳ ව චක්‍ර ලේඛනයක් ද නිකුත් කර ඇත.



◆ ශ්‍රී ලංකාවේ ගුරු මධ්‍යස්ථාන 81ක භාරකරුවන් සඳහා කෙටි කාලීන පුස්තකාල පුහුණු වැඩසටහනක් අදියර දෙකක් යටතේ ජාතික අධ්‍යාපන ආයතන පුස්තකාලය මුල් කර ගෙන සංවිධානය කර ඇත. එම මධ්‍යස්ථානවල පුස්තකාල විධිමත් ව පවත්වා ගෙන යාම පිළිබඳ ව ප්‍රායෝගික කටයුතුවලට වැඩි අවධානයක් යොමු කරමින් මෙම පුහුණුව ලබා දෙනු ලැබේ.


◆ ජාත්‍යන්තර අධ්‍යාපන සැළසුම්කරණ මධ්‍යස්ථානයේ නීතිමය තැන්පතු පුස්තකාලයක් ලෙස ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලය නම් කර ඇත. මේ අනුව එමගින් ප්‍රකාශයට පත් කරනු ලබන සෑම ප්‍රකාශනයක ම පිටපත් දෙකක් ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලයට ලැබේ.

◆ විදුහල්පතිවරු සඳහා පැවැත්වෙන පාඨමාලාවල දී විඥාපන සේවා පිළිබඳ ව න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබේ. ජාතික අධ්‍යාපන ආයතනයට අයත් මීපේ කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ දී මේ දක්වා එවැනි පාඨමාලා තුනක් පවත්වා ඇත.

## එන්.අමරසිංහ මහතාට උපහාර

කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය ආරම්භ කිරීමෙහිලා පුරෝගාමී මෙහෙයක් ඉටු කළ එන්.අමරසිංහ මහතා පිළිගැනීමේ සුහද හමුවක් 2002 පෙබරවාරි මස කැළණිය විශ්ව විද්‍යාලයේ දී පවත්වන ලදී. මෙම අවස්ථාවට අධ්‍යයන අංශ ආචාර්ය මණ්ඩලය, සිසුන් සහ ආදි විද්‍යාර්ථීන් රැසක් සහභාගී වූහ.
මෙරට පුස්තකාල සේවාව නංවාලීමෙහිලා විශාල මෙහෙයක් කළ එන්.අමරසිංහ මහතා දැනට පැපුවානිව්ගිනියා රජාති විශ්ව විද්‍යාලයේ සේවයේ යෙදී සිටී

## වත්තේගම මහජන පුස්තකාලය




පුස්තකාල පාඨක සමාජයේ ළමුන්ගේ කලා කුසලතා එළි දැක්වීම සඳහා පාරම්පරික නැටුම් කලාවන් පිළිබිඹු කිරීම අරමුණු කරගත් විවිධ ප්‍රසංගයක් වත්තේගම නගර ශාලාවේ දී 2002.01.03 දින පවත්වනු ලැබිණි.

# தேசிய நூலகச் செய்திகள்

## பயிற்சி பட்டறைகள்

மேல் மாகாணத்தின் தேசிய பாடசாலைகள் /கல்வியியல் கல்லூரிகள் / ஆசிரிய பயிற்சிக் கலா சாலைகளைச் சேர்ந்த நூலகர்களின் பொருட்டு 2002.02.13 ஆம் 14 ஆம் திகதிகளில், பாடசாலை நூலக அபிவிருத்தி என்னும் தலைப்பின் கீழ் பயிற்சிப் பட்டறை ஒன்று தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் கேட்போர் கூடத்தில் நடத்தப்பட்டது. இப் பாடநெறியில் 51 பேர் பங்குபற்றினர்.

## மாநாடுகள்

தேசிய பாடசாலை, ஆசிரிய கலாசாலை, கல்விக் கல்லூரிகளின் நூலகர்களின் பொருட்டு ஒரு நாள் மாநாடு ஒன்று 2002.03.01 ஆம் திகதி தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையில் நடத்தப்பட்டது. இதில் 54 பேர் பங்கு பற்றினர்.

வடகிழக்கு மாகாணத்தின் முகாமைத்துவ அபிவிருத்தி மற்றும் பயிற்சித் திணைக்களம் ஒழுங்குபடுத்தியிருந்த பொது நூலகர்களுக்கான அபிவிருத்தி மதிப்பாய்வு மாநாடானது 2002.03.11 ஆம் திகதி திருகோணமலை, நகர சபை மண்டபத்தில் நடத்தப்பட்டது. இம் மாநாட்டில் 08 சிங்கள மொழி மூல நூலகர்களும், 34 தமிழ் மொழி மூல நூலகர்களும் பங்குபற்றினர்.

## பயிற்சிப் பாடநெறி

கிழக்கு மாகாண பாடசாலை நூலகர்களின் பொருட்டு நாலு நாள் பாடநெறி ஒன்று 2002.03.07 இலிருந்து 10 ஆம் திகதி வரை திருகோணமலை அக்போபுரவில் உள்ள மனித வள மத்திய நிலையத்தில் நடத்தப்பட்டது. வடகிழக்கு மாகாணத்தின் முகாமைத்துவ அபிவிருத்தி பயிற்சி திணைக்களத்துடன் இணைந்து ஒழுங்குபடுத்தப்பட்டிருந்த இப் பயிற்சிப் பாடநெறியில் 34 சிங்கள மொழி மூல நூலகர்களும் 80 தமிழ் மொழி மூல நூலகர்களும் பங்குபற்றினர்.

## தேசிய நூலக விரிவுரைத் தொடர்

2002 ஆம் ஆண்டின் முதற் காலாண்டுப் பகுதியில் நடத்தப்பட்ட தேசிய நூலக விரிவுரைகளின் தலைப்பும் விரிவுரையாளர்களின் பெயரும் கீழ்க் காட்டப்பட்டுள்ளவாறாகும்.

| **விரிவுரையாளர்** | **தலைப்பு** |
|---|---|
| டாக்டர். பிரியங்கர த சில்வா<br>2002.01.23 | உள்ளடங்கியுள்ள திறமைகளை வெளிக் கொண்டுவருதல். |
| திரு. மோகான் சமரநாயக்க<br>2002.02.20 | பிரச்சினைகளைத் தீர்ப்பது தொடர்பான சர்வதேச அனுபவம். |
| கலாநிதி.கே.டி.ஜி.விமலரத்ன<br>2002.03.26 | Towards a National Identity through the Costumes of Sri Lanka |

## நூலகங்களுக்கிடையேயான நூல் இரவல் வழங்கும் திட்டம்

2002 ஜனவரி - மார்ச் காலப்பகுதியில் நூலகங்களுக்கிடையேயான நூல் இரவல் வழங்கும் திட்டத்தின் கீழ் நூலக சங்கம், தேசிய விஞ்ஞான மன்றம், இலங்கைத் தேசிய எந்திரவியல் அபிவிருத்தி மத்திய நிலையம், றுஹுணுப் பல்கலைக்கழகம், சப்ரகமுவப் பல்கலைக்கழகம், மற்றும் மொறட்டுவைப் பல்கலைக்கழகம் என்பன வற்றிக்கு நூல்களும், சஞ்சிகைகளும் வழங்கப்பட்டுள்ளன.

## நூற் கண்காட்சி

2002 பெப்ரவரி 26 ஆம் திகதியிருந்து மார்ச் 03 ஆம் திகதி வரை வாசிப்புப் பழக்கத்தை ஊக்குவிக்கும் செயற்திட்டத்தின் கீழ், நூற் கண்காட்சி ஒன்று தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையில் நடத்தப்பட்டது.

## நூல் அன்பளிப்புக்கள்

2002 ஜனவரி - மார்ச் காலப் பகுதியில் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையினால் 61 பாடசாலை நூலகங்களுக்கும், 65 பொது நூலகங்களுக்கும், 02 பிரிவேன நூலகங்களுக்கும், 277 ஏனைய நூலகங்களுக்குமாக மொத்தம் ரூபா. 450568.80 பெறுமதியான நூல்கள் அன்பளிப்புச் செய்யப்பட்டுள்ளன.

## வாசிப்புப் பழக்கத்தை ஊக்குவிக்கும் செயற்திட்டம்

2002.02.20 ஆம் திகதியில் இருந்து 2002.03.03 ஆம் திகதி வரையிலான 02 கிழமைகளில் வாசிப்புப் பழக்கத்தை ஊக்குவிப்பதற்கான செயற்திட்டமொன்று தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையினால் நடைமுறைப்படுத்தப்பட்டது. இச் செயற்திட்டத்தின் கீழ் 04 பாடசாலைகளில் வாசிப்புப் பழக்கத்தை ஊக்குவிக்கும் செயற்திட்டம் நடைமுறைப்படுத்தப்பட்டதுடன், இதற்காக பொரளை சீ.டபிள்யு.டபிள்யு. கன்னங்கர வித்தியாலயம், நாராஹேன்பிட்டியாவில் உள்ள டட்லி சேனாநாயக்க வித்தியாலயம், பாமன்கடை தமிழ் வித்தியாலயம், மாளிகாவத்தை தாருஸ் சலாம் வித்தியாலயம் என்பன தெரிந்தெடுக்கப்பட்டிருந்தன.

இதற்கும் மேலால் 2002.02.26 ஆம் திகதியிலிருந்து 2002.03.03 ஆம் திகதி வரை நூற் கண்காட்சியொன்றும் விற்பனைக் கூடமும் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையில் நடத்தப்பட்டதுடன், இதன் ஆரம்ப விழாவிற்கு கௌரவ கல்வி, கலாச்சார மற்றும் மனிதவள அபிவிருத்தி அமைச்சர் கலாநிதி கருணாசேன கொடித்துவக்கு வருகை தந்திருந்ததுடன் மேற்குறிப்பிடப்பட்ட நூலகங்களுக்கு நூல் அன்பளிப்புக்களும் வழங்கப்பட்டன.

## பல்வேறு மாநாடுகள்

இலங்கை நூலக சங்கத்தைச் சேர்ந்த அரசாங்க நூலகர் குழுவும், தொழிற் திணைக்களத் தின் ஊழியர் கல்வி பிரிவும் இணைந்து நடத்திய நூலகர்கள் முகாமையாளர்களுக்கான "வள முகாமைத்துவம்" என்னும் தொனிப் பொருளின் கீழ் 2002.02.21 ஆம் திகதி மாநாடொன்றை நடத்தினர்.

## வடகிழக்கு மாகாண பாடசாலை மற்றும் பிரிவேனாக்களுக்கு நூல் உதவி

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் தொழிற்சங்கங்களும், நலன்புரி சங்கமும் ஒன்றிணைந்து அரசின் நூறு நாள் வேலைத் திட்டம் மற்றும் சமாதானச் செயற்திட்டத்துடன் தொடர்பு படுத்தி ஒழுங்கு செய்திருந்த கிழக்கு மாகாணத்தில் உள்ள வசதி குறைந்த பாடசாலைகளின் பொருட்டான நூல் அன்பளிப்பு செய்தல் 2002.02.27, 28 ஆம் திகதிகளில் நடத்தப்பட்டது.

05 சிங்கள மொழி மூலப் பாடசாலைகளுக் கும், 03 தமிழ் மொழி மூலப் பாடசாலைகளுக்கும், 02 பிரிவேன நூலகங்களுக்கும் இடையே ரூ.64500/பெறுமதியான நூல்களும், ரூபா. 18,000 பெறுமதி யான அப்பியாசப் புத்தகங்களும் பகிர்ந்து அளிக்கப்பட்டதுடன், இறுதியில் வாசிப்புப் பழக்கம் தொடர்பாக விரிவுரைகளும் இப் பாடசாலைகளில் நடத்தப்பட்டன. ஒரு தொகை உடைகள் அப் பிரதேச மக்களுக்கு பகிர்ந்தளிப்பதற்காக சேருவில விகாராதிபதியிடம் ஒப்படைக்கப்பட்டது.

## பிற நூலகச் செய்திகள்

### கண்டி டி.எஸ். சேனநாயக்க ஞாபகார்த்த பொது நூலகம்

1841 ஆம் ஆண்டில் மத்திய மாநகர நூலகமாக கண்டியில் ஆரம்பிக்கப்பட்ட இந் நூலகம் 1920 ஆம் ஆண்டு வரை அங்கத்துவம் செலுத்திய ஆங்கில கல்வி அறிவுடைய உள்ளூர் வெளியூர் வாசகர்களின் பொருட்டு நடத்தப்பட்டு வந்தது. பொருளாதார காரணங்களுக்காக இந்த நூலகத்தை கொண்டு நடத்துவதற்கு இயலாமல் போன காரணத்தால் 1920 ஆம் ஆண்டு கண்டி மாநகர சபையிடம் இந் நூலகம் ஒப்படைக்கப்பட்டது. நாட்டில் முதல் முதலாக ஆரம்பிக்கப்பட்ட பொது நூலகமான இந் நூலகம் சரித்திர முக்கியத்துவம் வாய்ந்ததாகும்.

ஆரம்பத்தில் திருகோணமலை வீதி (தற்போது டீ.எஸ். சேனாநாயக்க வீதி) யில் செயற்பட்டு வந்த இப் பொது நூலகம் 1962 ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் 20 ஆம் திகதி தற்போதைய கட்டிடத்திற்கு கொண்டு செல்லப்பட்டது. 1980-12-23 ஆம் திகதி இலங்கையின் முதலாவது பிரதமரான மதிப்பிற்குரிய டீ.எஸ். சேனாநாயக்க அவர்களால் அடித்தள மிடப்பட்டதால் அவரின் ஞாபகமாக டீ.எஸ். சேனாநாயக்க ஞாபகார்த்த நூலகமாக பெயர் சூட்டப்பட்டுள்ளது.

தற்போது சுமார் 80 வருட காலமாக கண்டிப் பிரதேசத்திற்கு மாத்திரமல்லாமல் நாட்டின் நாலா பக்கங்களிலும் இருந்து வருகை தரும் வாசகர் களுக்கு தேவையான அறிவை, தகவல்களை வழங்கு வதில் பாரிய சேவையாற்றி வரும் / இந் நூலகத்தின் சேவைகளைக் கவனத்தில் கொண்டு மேலும் இட வசதியை பெற்றுத்தருமுகமாக கட்டப்பட்ட கட்டிடமானது 2002 ஜனவரி மாதம் 19 ஆம் திகதி சுதேச செயற்பாடுகள், மாகாண மற்றும் உள்ளூராட்சி மாகாண சபை அமைச்சர் கௌரவ அலிக் அலுவிகார அவர்களினால் திறந்து வைக்கப்பட்டது.

இந்த புதிய கட்டிடத் தொகுதியில் வாசகர்களுக்கு மேலும் வசதிகளை செய்து கொடுக்கும் நோக்குடன் பூரணமானதொரு தகவல் தொழில் நுட்ப சேவைப் பிரிவை நடைமுறைப்படுத்திச் செல்லத் திட்டமிடப்பட்டுள்ளது. நெரிசலான இடத்தில் நடைமுறைப்படுத்தப்பட்டு வந்த இரவல் வழங்கும் மற்றும் உசாத்துணை பிரிவுகளை போதியளவு இடவசதியுடன் விரிவுபடுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது.

### வத்தேகம பொது நூலகம்

நூலக வாசகர்களின் பிள்ளைகளின் கலைத் திறமையை வெளிக்க கொண்டு வரும் முகமாகவும் பாரம்பரிய நடனக் கலையை ஊக்குவிக்கும் நோக் கத்துடனும் கலை நிகழ்ச்சி ஒன்று வத்தேகம நகர மண்டபத்தில் 2002.01.03 ஆம் திகதி நடத்தப்பட்டது.

### நூலகக் கட்டிடம்

இஹல் வேல்வல கூ.க. சங்கத்தின் உதவியுடன் கட்டப்பட்ட இரு மாடிக் கட்டிடத்தின் முதல் மாடியில் தர்மசிறி கமகேயின் பெற்றோரின் சேவை நலம் பாராட்டும் நூலகத்தின் திறப்பு விழா கடந்த நாட்களில் நடைபெற்றது.

புதிய கல்வி மறுசீரமைப்பு செயற்திட்டத்திற்கு அமைய ஒரு கல்வி வலயத்திற்கு 10 நூலகங்களை பெற்றுக் கொடுக்கும் செயற்திட்டத்தின் கீழ் ஆசிய அபிவிருத்தி வங்கியின் உதவியின் கீழ் 06 இலட்சம் ரூபா செலவில் கட்டப்பட்ட மஹஇலுப்பல்லம கலே திவுள்வவ பாடசாலை நூலகக் கட்டிடமானது வட மத்திய மாகாண முதல் அமைச்சர் திரு. பேட்டி பிரேமலால் திசாநாயக்க வினால் திறந்து வைக்கப்பட்டது.

## விஜேவர்த்தன ஞாபகார்த்த தொடர்பு சாதன நூலகம்

இருபதாம் நூற்றாண்டில் நடைபெற்ற முக்கிய நிகழ்வுகள் / சரித்திர சான்று பகரும் தகவல் அறிக்கைகள் எல்லாவற்றையும் ஒரு இடத்தில் கொண்டுள்ள மத்திய நிலையமான இது இப்போது ஆராய்ச்சியாளர்கள், கல்விமான்கள், மாண மாணவி கள், மற்றும் பத்திரிகைத் துறையினரின் பிரயோசனத் திற்காக திறந்து வைக்கப்பட்டுள்ளது. இந்த ஆவணச் சேகரிப்பில் :-

- 1940 ஆம் ஆண்டில் இருந்து சேகரிக் கப்பட்ட பிரசித்தி பெற்ற நபர்களின் வாழ்க்கை வரலாறு மற்றும் எழுத்தாளர்களின் கடிதங்கள் கட்டுரைகள் போன்ற 33,000 கோப்புக்கள் உள்ளன.
- 1832 ஆம் ஆண்டில் இருந்து வெளிவந்த புதினத்தாள்களும் பருவ வெளியீடுகளும்
- அரசியல், சரித்திரம், கலாசாரம் மற்றும் சமூக நிகழ்வுகள் உட்பட பல்வேறு நிகழ்வுகள் உட்பட பல்வேறு பொருட் தலைப்புக்களின் கீழான 5500 கோப்புக்கள்
- சுதந்திரத்தின் பின் வெளியிடப்பட்ட பெருந் தொகையான புகைப்படங்களின் பிரதிகளைப் பெற்றுக் கொள்வதற்கான வசதிகளும் உள்ளது.
- சாதாரண தர மற்றும் உயர்தர மாணவர் களின் செயற்திட்ட வேலைகளுக்குத் தேவையான தகவல்களைப் பெற்றுக் கொள்வதற்கும் வசதிகள் உள்ளன.
- கிழமை நாட்களில் (பொது விடுமுறை மற்றும் வர்த்தக விடுமுறை தினங்கள் தவிர) திங்கட்கிழமை தொடக்கம் வெள்ளிக்கிழமை வரை காலை 9.00 மணியில் இருந்து மாலை 4.00 மணி வரை நூலகம் திறந்திருக்கும்.

**விபரங்களுக்கு**
நூலகர்
தொலைபேசி : 429429 / 491
விஜேயவர்த்தன ஞாபகார்த்த நூலகமும் ஆவணவாக்கல் மத்திய நிலையமும்
அசோசியேட்டட் நியூஸ் பேப்பர்ஸ் ஒப் சிலோன் லிமிட்டட்
லேக்ஹவுஸ்
கொழும்பு

## இலங்கை நூலக சங்கத்தின் நூலகம்

இலங்கை நூலக சங்கத்தின் நூலகம் மற்றும் தொழில்சார் தகவல் மத்திய நிலையமானது 2002.02.22 ஆம் திகதி மீளத் திறக்கப்பட்டுள்ளது.

## கொழும்பு பல்கலைக்கழக நூலகம்

கொழும்பு பல்கலைக்கழகமும், ஜய்காவும் ஒன்றி ணைந்து கல்விச் செயற்திட்டங்களை நடைமுறைப் படுத்தும் குருணாகல் மாவட்டத்தில் உள்ள பல கிராமங்களில் உள்ள நூலகர்களின் பொருட்டு நூலக அபிவிருத்திப் பயிற்சிச் செயற்திட்டம் ஒன்றை 2002.03.8,9 ஆம் திகதியில் நடத்தினர்.

## மொறட்டுவ பல்கலைக்கழக நூலகம்

மொறட்டுவப் பல்கலைக்கழக நூலகம், மென் பொருளை உபயோகித்து அதன் சகல செயற் பாடுகளையும் தன்னியக்கமாக்கும் செயற்பாட்டை 2001-11-16 ஆம் திகதி ஆரம்பித்து வைத்தது. இவ் வைபவத்தில் பிரான்ஸ் நாட்டின் தூதுவர் அலுவலகத்தில் கலாசார ஆலோசகராகக் கடமை யாற்றும் எச்.இ.

ஜாக்குஸ் சரியா் பிரதம விருந்தினராகக் கலந்து கொண்டதுடன், பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவின் தலைவா் பேராசிரியா் பீ.ஆா்.என். மென்டிஸ் சிறப்பு விருந்தினராகக் கலந்து கொண்டாா்.

இந்த மென்பாண்டத்தை உபயோகிப்பதன் மூலம் மாணவா்களும் பல்கலைக்கழக விரிவுரையாளா்களும் அதேபோல நூலக ஊழியா்களும் நூலக பட்டியற் தரவுகளுக்கு இலகுவாகவும் விரைவாகவும் பிரவேசிக்க முடிகின்றது. அதேபோல நூலீட்டல், பட்டியலாக்கம், நூல் இரவல் வழங்கல், பருவ வெளியீட்டுக் கட்டுப்பாடு போன்ற சகல செயற்பாடு களும் தன்னியக்கமாக்கப்பட்டுள்ளது.

## Argees Sri Lanka Web Index, A Profile of Sri Lankan websites

இணையத்தில் இலங்கை பற்றிய விடயங்கள் நாளுக்கு நாள் அதிகரித்துக் கொண்டே வரு கின்றன. இச் சுட்டியில் இலங்கையில் வெளியிடப் பட்ட வெப்தளங்கள் பல்வேறு பொருட் தலைப்புக் களின் கீழ் கோவைப்படுத்தப்பட்டு சுட்டியாக்கம் செய்யப்பட்டுள்ளது. இலங்கை தொடா்பாக ஏற்கனவே 907 வெப் தளங்கள் இருப்பதுடன், அவை கீழே குறிப்பிடப்பட்டுள்ள 07 பொருட் தலைப்புக்களின் கீழ் ஒழுங்குபடுத்தப்பட்டுள்ளது.

* வாணிப, வியாபாரத் துறை, கல்வி
* கணனி மற்றும் இணையம்
* செய்தி மற்றும் தொடா்புசாதனம்
* சமயமும் சமூகமும்
* அரசியல் மற்றும் அரசாங்கம்
* சுற்றுலாத் துறை

தொகுப்பு : றுவன் கமகே (உதவி நூலகா்)
மொறட்டுவப் பல்கலைக்கழகம்

## தேசிய கல்வி நிறுவக நூலகம்

தேசிய கல்வி நிறுவக தொடா்பு சாதன பிரிவினால் பாடசாலை உடல் ஆரோக்கிய செயற்திட்டத்தை நடைமுறைப்படுத்தும் நோக்கத்துடன் செவிப்புல ஆடியோ நாடாக்கள் 10,000 மும் வீடியோ நாடாக்கள் 2000 மும், கல்வி அமைச்சின் உடல் ஆரோக்கிய விளையாட்டு துறை அமைச்சிடம் ஒப்படைக்கப்பட்டுள்ளது. இச் செயற்திட்டத்தை நாட்டில் உள்ள சகல பாடசாலைகளிலும் நடைமுறைப்படுத்துவதற்கு தீா்மானிக்கப்பட்டுள்ளதுடன், அது தொடா்பாக அவா்கள் எமுத்தாளா்களுக்கும் நன்றி செலுத்தியுள்ளாா்கள்.

இலங்கையின் 81 ஆசிரிய மத்திய நிலையங்களுக்குப் பொறுப்பாகவுள்ள ஆசிரியா்களின் பொருட்டு குறுங்கால நூலகப் பயிற்சி வகுப்பொன்று இரு கட்டங்களாக தேசிய கல்வி நிறுவனத்தின் தலைமைத்துவத்தின் கீழ் ஒழுங்குபடுத்தப்பட்டிருந் தது. அம் மத்திய நிலையங்களில் உள்ள நூலகங் களை ஒழுங்காக நடைமுறைப்படுத்திச் செல்தல் தொடா்பாக செயல்முறைச் செயற்பாடுகளுக்கு அதிக அவதானம் கொடுக்கப்பட்டு இப்பயிற்சி வழங்கப்பட்டது.

சா்வதேச கல்வியை திட்டமிடும் மத்திய நிலையத்தின் சட்டவைப்பு நூலகமாக தேசிய கல்வி நிறுவன நூலகம் பெயரிடப்பட்டுள்ளது. இதன் பிரகாரம் இதனால் வெளியிடப்படும் சகல வெளியீடுகளிலும் இரு பிரதிகள் தேசிய கல்வி நிறுவன நூலகத்திற்கு கிடைக்கும்.

ஆசிரியா்களின் பொருட்டு நடத்தப்படும் பாட நெறிகளில் தகவல் விஞ்ஞானம் பற்றிய கோட்பாடும் செய்முறைப் பயிற்சியும் பரந்தளவில் நடைமுறைப்படுத்திச் செல்லப்படுகின்றது. தேசிய கல்வி நிறுவனத்திற்கு சொந்தமான மிபேயிலுள்ள முகாமைத்துவ பயிற்சி மத்திய நிலையத்தில் இதுவரை இவ் விதமான மூன்று பாடநெறிகள் நடத்தப்பட்டுள்ளன.

# National Library News

## Workshops

A workshops on Development and Modernization of School Libraries was held for librarians of Schools/National Colleges of Education/Teacher Training Colleges in the Western Province on 13th and 14th February 2002 at the NLDSB auditorium. 51 Librarians participated in this event.

## Seminars

* A Seminar was held for Librarians of National Schools/Teacher Training Colleges/NCOE s on 01.03.2002 at the NLDSB auditorium. 54 participants attended the seminar.
* A Seminar for reviewing the progress of Public Librarians of North and East Province was held on 11.03.2002 at the Town hall, Trincomalee in both Sinhala and Tamil medium. 8 Sinhala me dium participants and 34 Tamil medium participants took part in this seminar. The seminar was organized by the NLDSB in collaboration with the Management Development and Training De partment (MDTD) OF N-E Province.

## Training Program

Four day Training program for the School Librarians of Eastern Province was held at the Human Resources Training Centre in Agbopura, Trincomalee from 07th March 2002 to 10th March, 2002. This training program was also organized by the NLDSB in collaboration with the Management, Development and Training Department. 34 Sinhala medium librarians and 80 Tamil medium librarians participated in this training program.

## Program on Promotion of Reading Habit

A Program on improving the reading habit among the school children was launched by NLDSB from 20.02.2002 to 03.30.2002. In the first stage four schools (2 Sinhala, 1 Tamil and 1 Muslim) were selected to introduce this program and this is a program to be continued throughout the year.



In addition to the above program an exhibition and a book sale was held at NLDC and Hon. Minister of Human Resources Development, Educationand and Cultural Affairs Dr.Karunasena Kodithuwakku was the chief guest at the inauguration.

## Inter-Library Loans

Under the Inter Library Loan Agreement, a fair amount of library materials were exchanged among SLLA, NSF, University of Ruhuna, University of Moratuwa and Sabaragamuwa University.

## National Library Lecture Series


Following lectures were held under the National Library lecture series during the 1st quarter of year 2002

| Lecturer | Title of the Lecture |
|---|---|
| Dr.Priyanga de Zoysa<br>23.01.2002 | නොනිමි සමන්කම් මතුකර ලීම |
| Mr.Mohan Samaranayake<br>20.02.2002 | ගැටුම් නිරාකරණය පිළිබඳ ජාත්‍යන්තර අත්දැකීම් |
| Dr.K.D.G.Wimalaratne<br>26.03.2002 | Towards a National identity through the costumes of Sri Lanka |

## Book Exhibitions

A book exhibition was organized by the NLDSB from 26th February to 3rd March 2002 to inaugurate the Reading Habit Promotion Program among school children.

## Book Aid for Schools in East Province



Welfare society and the Trade Unions of NLDSB distributed books/exercise books valued Re. 82,500 among some selected a less privileged schools & Pirivenas in Eastern Province, on 27-28 of February 2002. This was done under 100 day program of the government with the beginning of peace process in this area.

# Other News

## Public Library - Kandy

A New building complex of Public Library, was declared open by Mr.Alick Aluvihare, Hon. Minister of Home affairs, Provincial Councils and Local Government on 19.01.2001.

## Public Library - Wattegama

A Concert was organized by Wattegama Public Library in order to give opportunities to its young readers to improve their artistic skills. It was held on 03 January 2002 at Wattegama Town Hall.

## New Library Buildings

A Library was declared open at Mahailluppallama Keledivulwewa Vidyalaya spending Rs. 0.6m. by Mr. Berty Premalal Dissanayaka, Chief Minister of North Central Province in January 2002. This is sponsored by the Asian Development Bank under a project launched by Ministry of Education.

## Wijewardena Memorial Media Library and Documentation Centre

A documentation centre was established recently at Lake House in order to provide easy access to current information for researchers, students and media personel. This consists of a large number of Biographies, Newspaper articles, Newspapers and Journals. It is important to note that this centre is opened from 9.00 a.m. to 4.00 p.m. from Monday to Friday.

**For details contact** :


Librarian
Wijewardena Memorial Media and
Documentation Centre
Associated Newspapers Ceylon Limited
Lake House, Colombo.
Tel. 429429 Ext. 491

## University of Moratuwa Library



University of Moratuwa Library has automated all its library functions using "Libsys" integrated library automation software. The new system was inaugurated on 16th November 2001, with the participation of H.B. Jacques Charrier, Cultural adviser, Embassy of France as the chief guest, & Prof. B.R.R.N.Mendis, Chairman, University Grants Commission was the guest of honour.

The new software will enable students, University staff & the library staff to smoothen and streamline functions relating to the library. New services will also be available for the membership. The Striking feature of this is the Online Public Access Catalogue, which allows members to request and recommend books for acquisition, reserve books and search the library catalogue online.




## Arjee's Sri Lanka web Index (A Profile of Sri Lanka )

The amount of information on Sri Lanka on Internet is rapidly increasing. Business entities, charities, government & political organizations and other establishments in Sri Lanka are rushing to mark their presence in the World Wide Web. An Index was compiled by Mr. Ruwan Gamage, Assistant Librarian of Moratuwa University using available information on Sri Lanka on Internet. This index builds up a profile of web sites of and related to Sri Lanka. There are 907

web sites of or related to Sri Lanka and identified web sites were categorized into 7 major areas namely Commerce and Trade, Computer and Internet, Education, Science and Technology, News and Media, Government and Politics, Society and Religion and Travel and Tourism.

## SLLA Library

The Library of Sri Lanka Library Assosiation was re-opened on 22 February, 2002.

## University of Colombo Library

A training program on library development was conducted for librarians in Kurunegala district on 08 and 09 of March 2002. This program was organized by University of Colombo in collaboration with JAICA.

## NIE Library

♦ The audio visual unit of the NIE has produced 10,000 cassettes and 2000 videos on daily physical exercise for School Children to be distributed among schools islandwide under the patronage of Ministry of Education.

♦ A short-term training program on Library and Information Science was launched in two stages for those who in charge of 81 teacher training centres islandwide. This is organized by the NIE in order to facilitate library services to teacher trainees.

♦ Steps have been taken to develop the knowledge of school principals on bibliographic services (both theory and practicals) when training programs are organized by NIE at Management Training Centre, Meepe.




## ULA office Bearers


Following are the office bearers of University Librarians Association (ULA) for the year 2001/2002

| | | |
|---|---|---|
| President | - | Mr. W.R.G.Silva, |
| Vice President | - | Mr. Punchi Banda Gallaba |
| | | Mr.K.S.Siriesna |
| Secretary | - | Mr. M.A.Milton |
| Asst. Secretary | - | Ms. Mahikanthi Thusitha Kumara |
| Treasures | - | Mr.G.N.Padmasiri |

## New Publications of the National Library and Documentation Centre




## New arrivals to LIS collection of NLDC



# 21 වන සියවසට ඩිවි දශම වර්ගීකරණයේ සාපේක්ෂ වැදගත්කම

ඩබ්.එම්.ඒ.කේ.විජේකෝන්
සහකාර පුස්තකාලයාධිකාරී
රජරට විශ්ව විද්‍යාලය
මිහින්තලේ

21 වන සියවස එළඹ ඇත. විශ්ව ගම්මාන සංකල්පය යථාර්තයක් වෙමින් පවතී. තොරතුරු මූල සමාජ, (Information society) දැනුම් සමාජ (Knowledge society) පිළිබඳ සංකල්ප සමාජගත වෙමින් පවතී. තොරතුරු තාක්ෂණ දියුණුව මත තොරතුරු හෙවත් දැනුම නිපයුමේ පුපුරා යාමක් සිදු වෙමින් පවතී. දැනුම් මාධ්‍ය කඩදාසි මාධ්‍යයේ සිට විද්‍යුත් මාධ්‍ය බවටත්, පුස්තකාල අතාත්වික පුස්තකාල බවටත් පරිවර්තනය වෙමින් පවතී. දැනුම බිහිවෙමින්, වෙනස් වෙමින්, අලුත් වෙමින් සහ නිශේධ වෙමින් පවතී.

උක්ත සමස්ත සංසිද්ධි තුළ දැනුම හෙවත් තොරතුරු එක්රැස් කර, ආරක්ෂා කර, සංවිධානය කර පාඨකයන්ට බෙදා හැරීමේ මූලික පුස්තකාල කාර්ය භාරය ද සංකීර්ණ වෙමින් පවතී. මෙම පසුබිම තුළ පුස්තකාල දැනුම සංවිධානය කිරීමේ ක්‍රමවේදයක් ලෙස වර්ගීකරණයට අදාළව 21 සියවසට ඩිවි දශම වර්ගීකරණයේ සාපේක්ෂ වැදගත්කම විශ්ලේෂණය කර බැලීම කාලෝචිත වේ.

## ඩිවි දශම වර්ගීකරණයේ විකාශනය

1876 දී මෙල්විල් ඩිවි විසින් ප්‍රකාශිත ඩිවි දශම වර්ගීකරණය 1996 වන විට සංස්කරණය 21 ලෙස ප්‍රකාශිත ව ඇත. ලෝකයේ ජනප්‍රියත ම වර්ගීකරණය ලෙස රටවල් 135කට අධික සංඛ්‍යාවක භාවිත මෙම වර්ග ක්‍රමය භාෂා 30කට අධික සංඛ්‍යාවකට පරිවර්තනය කරනු ලැබ ඇත.

1876 මෙල්විල් ඩිවි විසින් ප්‍රකාශිත ඩිවි දශම වර්ගීකරණයේ පළමු සංස්කරණයේ සිට 1996 ජෝන් එස්.මිෂෙල් විසින් සංස්කරණය කරන ලද ඩිවි 21 වන සංස්කරණය දක්වා වූ ප්‍රකාශන ඉතිහාසය තුළින් ප්‍රකට වනුයේ තත්කාලීන දැනුම පරිණාමයට සාපේක්ෂව ඩිවි වර්ග ක්‍රමයේ විකාශනයයි. විශ්ව ඥාන පරිණාමයට සමගාමීව ඩිවි වර්ග ක්‍රමය වෙනස් වීමට ගත් ප්‍රයත්නයයි.

පොත් පත් රාක්කගත කිරීමේ අවශ්‍යතාව පදනම් කර ගෙන පරිගුණිත වර්ග ක්‍රමයක් ලෙස බිහි වූ ඩිවි දශම ක්‍රමයට තත්කාලීන විෂය විශ්ලේෂණ පදනමෙ යම් යම් වෙනස්කම් ඇති කර ගැනීමට සිදුවිය. වෙනත් විෂය විශ්ලේෂණීය, සංස්ලේෂණීය මුඛාශ්‍රිත වර්ග ක්‍රමවලින් එල්ල වූ බලපෑම හා කාලීන විෂය අවශ්‍යතා සමගාමී ව පරිගුණිත වර්ගීකරණ රටාවෙන් මිදීමට ඩිවි දශම වර්ගීකරණය ගත් උත්සාහය එහි සංස්කරණ විකාශන ඉතිහාසය තුළ පැහැදිලි ලක්ෂණයකි. එය මෙම වර්ග ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම සහ සජීවී බව තහවුරු කරන්නකි. එසේ ම එය 21 සියවස තුළ ද ඩිවි දශම වර්ග ක්‍රමයේ චලංගුභාවය තහවුරු කරයි. එය එහි සංස්කරණ විකාශනය තුළ මැනවින් හඳුනාගත හැකිය.

1876 දී ඩිවි වර්ග ක්‍රමය මුලින් ම ප්‍රකාශිත වූයේ පිටු 44ක ප්‍රකාශනයක් ලෙසිනි. එය 1996 දී 21 සංස්කරණය වන විට පිටු 3613ක ප්‍රකාශනයකි. 1952 එළිදැක් වූ 15 සංස්කරණය දක්වා එය පළවූයේ වෙළුම් එකක් ලෙසය. 1958 දී පළ වූ 16 සංස්කරණය සහ 1965 දී පළ වූ 17 සංස්කරණය දක්වා වෙළුම් 2ක් ලෙසත්, 18 සහ 19 සංස්කරණ වෙළුම් තුනක් සහ 20, 21 සංස්කරණ වෙළුම් 4ක් ලෙස ප්‍රකාශිතය. සංස්කරණ වැඩිවීමත් සමග ඒවායේ ඇතුළත් සංලේඛ ද ප්‍රමාණාත්මක ව වැඩි විණි. වැඩි වර්ගාංක ප්‍රමාණයක් ද හඳුන්වා දුනි. නව විෂය ශීර්ෂ හඳුන්වා දීම හා විෂය යුක්ති මගින් විෂය විශ්ලේෂණ සංස්ලේෂණ අවකාශ පුළුල් කර ගැනීම සිදු විය.

16 සංස්කරණය මගින් රූපන බෙදුම් වක්‍රය ද, 17 සංස්කරණයෙන් ප්‍රමිත උපබෙදුම් හා ප්‍රදේශ වක්‍රය හඳුන්වා දුණි. මෙමගින් විෂයක ස්වරූපීය ලක්ෂණ කැටි කර දැක්වීමේ අවස්ථාව උදාවිය. 18 සංස්කරණයෙන් සහාය වක්‍ර සංඛ්‍යාව 7 දක්වා වැඩි කරනු ලැබ ඇත. මෙමගින් අංකනයේ ප්‍රසාරණීයතා ගුණාංගය ඇති කර ගැනීමට පියවර ගැනිණි. දශම තිත භාවිතය, ස්මෘති සහායක ලක්ෂණ සහ විෂය විශ්ලේෂණ යුක්ති හඳුන්වා දීම මගින් වර්ග ක්‍රමය මුඛාශ්‍රිත තත්ත්වයට ගෙන ඒමට කටයුතු සිදු විය.

18 සහ 19 සංස්කරණ මගින් වර්ග ක්‍රමයේ ප්‍රධාන වෙනස්කම් රැසක් සිදු කරනු ලැබ ඇත. විෂය විශ්ලේෂණය සඳහා පුළුල් අවකාශයක් මින් සැළසුණි. 19 සංස්කරණයෙන් 301, 324, 340, 510 වර්ග පන්ති සම්පූර්ණයෙන් වෙනස් කර නව ෆීනික්ස් අනුසූචි හඳුන්වා දෙනු ලැබීය. 1989 ප්‍රකාශිත 20 සංස්කරණයෙන් මුඛාශ්‍රිත වර්ග ක්‍රමයක් බවට පත්වීම ප්‍රවේගවත් කරනු ලැබ ඇත. ඒ අනුව 20 සංස්කරණය කාණ්ඩ 4කින් පළ කිරීම, නව හැඳින්වීමක්

යෙදීම, සංශෝධිත උපලේඛන භාවිතය, අනුසූචිය කාණ්ඩ දෙකක් ලෙස භාවිතය, 01 සහ 03 සහාය වක්‍ර ප්‍රමාණවත් ලෙස සංශෝධනයට හා අර්ථවත් භාවිතයට හැකි පරිදි සාපේක්ෂ අනුක්‍රමණිකාව සැකසීම යනාදී වශයෙන් වෙනස්කම් රාශියක් සිදු කරනු ලැබ ඇත.

## 21 සංස්කරණය

1996 දී 21 සංස්කරණය කාණ්ඩ 4කින් යුක්තව පළ කරනු ලැබූ මෙය භෞතික පරිහරණය වඩාත් පහසු කරනු ලැබ ඇත.

**පළමු වෙළුම :**

පෙරවදන, 21 සංස්කරණයේ නව ලක්ෂණ හඳුන්වා දීම, පාරිභාෂිත ශබ්ද මාලාව සඳහා අනුක්‍රමණිකාව, ඩිවි ප්‍රකාශන ඉතිහාසය, සහායක වක්‍ර මෙයට අඩංගුය.

**දෙවන වෙළුම:**

විෂය සාරාංශ සහ 000-599 දක්වා ප්‍රධාන වර්ග පංති අනුසූචි

**තෙවන වෙළුම :**

600-999 දක්වා ප්‍රධාන වර්ග පංති අනුසූචි

**හතරවන වෙළුම :**

සාපේක්ෂ අනුක්‍රමණිකාව සහ අත්පොත

**නවාංග සහ ප්‍රවනතා :**

ඩිවි 21 සංස්කරණය 21 වන සියවසේ අවශ්‍යතා සමග සමගාමී වන අයුරින් ප්‍රථම වරට සංයුති දෙකකින් ඉදිරිපත් කරනු ලැබ ඇත.

1. මුද්‍රිත මාධ්‍ය පිටපත (in print)
2. පරිගණක මාධ්‍ය පිටපත (Dewey for windows CD-ROM)

නූතන පරිගණක භාවිත පරිසරය හා සංවේදී වීමට ඩිවි දශම වර්ග ක්‍රමය ගත් ප්‍රථම උත්සාහය ලෙස, ඩිවි පරිගණක මාධ්‍ය පිටපත හඳුන්වා දීම සැලකිය හැකිය.

පාඨක මිත්‍රශීලී භාවිතය සහ ජාත්‍යන්තර භාවිතය සඳහා පසුබිම සැකසීම, 21 සංස්කරණය 21 සියවසේ අවශ්‍යතා සමග සමගාමී වීමක් ලෙස හඳුනා ගත හැකිය. මෙහි දී එම කාර්යය පහසු වීම සඳහා උපදෙස් සහ විස්තර කිරීම වඩාත් නිරවුල් ව, පැහැදිලි ව දක්වනු ලැබ ඇත. හඳුන්වා දෙන වර්ගීකරණ අත්පොත මේ සඳහා වූ මහඟු මාර්ගෝපදේශයකි. වර්ගීකරණයේ වචනාවලිය පවත්නා තත්ත්වයට ගැළපෙන පරිදි සහ සංවේදීතාව සුරැකෙන සේ නවීකරණය කරනු ලැබ ඇත. ඒ අනුව ලොව පුරා වූ විවිධ පුස්තකාල අවශ්‍යතා සහ ජාත්‍යන්තර අවශ්‍යතා සැලකිල්ලට ගෙන ඇති බව ප්‍රකට වේ.

ඩිවි 21 සංස්කරණය 21 සියවසට සාපේක්ෂව වෙනස්වීමට ගත් උත්සාහය එහි අරමුණු තුළ ද ප්‍රකාශිතය.

1. සංකීර්ණ විෂය සංකල්ප ආවරණය
2. බටහිර පක්ෂපාතිත්වය අවම කිරීම

යන අරමුණු තුළ ඒ සඳහා දරන ප්‍රයත්න පැහැදිලිය.

සංකීර්ණ විෂය සංකල්ප ආවරණය යන අරමුණ ඉටු කර ගැනීමේ දී පරිගණිත වර්ග ක්‍රම හා බැඳුණු සීමා සහිතකම දක්නට ලැබේ. එහෙත් මුඛාශිත වර්ගීකරණ මගින් එම සීමා අතික්‍රමණය කළ හැකි වේ. ඒ අනුව යමින් විෂය විශ්ලේෂණීය සංස්ලේෂණීය ගුණාංග ඇති කරමින් සහ වැඩි දියුණු කරමින් පරිගුණිත වර්ගීකරණ රටාවෙන් මිදීමට ඩිවි සාර්ථක උත්සාහයක් දරනු ලැබ ඇති බව 21 සංස්කරණයෙන් කැපී පෙනේ.

විශ්ව දශම සහ දෙතිත් යනාදී මුඛාශිත වර්ග ක්‍රම හා අදාළව සංකේත සහ මිශ්‍ර අංකනය මගින් සිදු කෙරෙන මෙම කාර්ය භාරය ඩිවි ශුද්ධ අංකන පරාසය තුළ මැනවින් කිරීමට ප්‍රයත්න දරනු දැකිය හැකිය.

මේ අනුව 21 සියවසට උචිත පරිදි වර්ගීකරණයේ ගුණාත්මක වර්ධනයක් තුළින් එහි අඛණ්ඩ පැවැත්ම සහ සජීවී බව තහවුරු කර ගැනීම සඳහා ඩිවි 21 සංස්කරණය මගින් ගෙන ඇති ධනාත්මක ලක්ෂණ කීපයක් වේ.

1. සංශෝධිත වර්ග පංති (Revised Classes)
2. සමාන්තර අනුසූචි (Parallel Schedules)
3. විශේෂිත අනු බෙදුම (Special Subdivisions)
4. සහායක වක්‍ර (Tables)
5. යුක්ති භාවිතය (Devices)
6. විෂයාන්තර සම්බන්ධතා විශ්ලේෂණය (Inter Subject Relation)
7. අන්තර් මුඛ සබඳතා විශ්ලේෂණය (Inter Facet Rela tion)
8. සාපේක්ෂ අනුක්‍රමණිකාව (Relative Index)
9. අත්පොත (Manual)

## සංශෝධිත වර්ග පංති (Revised Classes)

ඩිවි 20 සංස්කරණයෙන් හඳුන්වා දුන් නවාංගයක් වූ මෙය ඩිවි 21 සංස්කරණය මගින් තව දුරටත් සංවර්ධනය කරනු ලැබ ඇත. මේ අනුව ඩිවි 21 හි ප්‍රධාන වර්ග පංති සංශෝධන 03ක් සිදු කර ඇත.

1. 350-354 - මහජන පරිපාලන
2. 370 - අධ්‍යාපනය
3. 560-590 - ජෛව විද්‍යා

මෙයට අමතරව 296 - යුදාගම, 297 - ඉස්ලාම්, 368 - රක්ෂණය යන වර්ග පංතිවල සැලකිය යුතු සංශෝධන කරනු ලැබ ඇත.

350-354 රාජ්‍ය පරිපාලනය වර්ග පංතිය සම්පූර්ණයෙන් ම සංශෝධනය කරනු ලැබ ඇත. බොහෝ අංක නව අර්ථකථන සහිතව නැවත භාවිතයට ගෙන ඇත. 20 සංස්කරණයෙන් 354 මධ්‍යම රාජ්‍ය පරිපාලනය (Administration of central government) යනුවෙන් දැක්වූ වර්ග පංතිය, 21 සංස්කරණයෙන් රාජ්‍ය පරිපාලනය (Public administration) වශයෙන් වාග් තලයෙන් පෝෂණය කරනු ලැබ ඇත. එසේ ම රාජ්‍ය පරිපාලනය පූර්ව සංස්කරණ පරිදි බල ප්‍රදේශ වශයෙන් නොව, විෂය වශයෙන් අවධාරණය කර වර්ග කිරීමට අවකාශ සලසනු ලැබ ඇත. මෙය වර්ගීකරණය බටහිරකරණය වීමට වලක්වා ජාත්‍යන්තරකරණය කිරීමට යෙදූ උපක්‍රමයක් ලෙස සුවිශේෂිත වේ. විෂය විශ්ලේෂණය සහ සංස්ලේෂණ අවශ්‍යතා සඳහා ද මින් පුළුල් ඉඩකඩක් සපයනු ලැබ ඇත.

රාජ්‍ය පරිපාලන වර්ග පංතිය යටතේ , 21 සංස්කරණයෙන් වෙනස් කරනු ලැබ 20 සංස්කරණයේ අංක සන්සන්දනාත්මක වගු මගින් පැහැදිලි කර දී ඇත.

| නිදසුන :- | 20 සංස්කරණයේ අංකය | 21 සංස්කරණයේ අංකය |
|---|---|---|
| ප්‍රධාන විධායකයින් තෝරා ගැනීම | 351.0034 | 324 |
| දෝෂාභියෝග | 351.993 | 342.068 |

මෙමගින් වර්ගීකරණයේ සුසංගත බවත්, තත්කාලීන විෂය සම්බන්ධතානුකූලව වෙනස් වීමට දරණ උත්සාහයත් පැහැදිලිය.

370 "අධ්‍යාපනය" 21 සංස්කරණයේ සංශෝධිත වර්ග පංතියක් ලෙස වැදගත් වේ. මෙහි මූලික වර්ග පංතිය වෙනස් නොකල ද, උප බෙදුම් වෙනස් කරනු ලැබ ඇත. එසේ ම ව්‍යාප්ත කිරීම් සහ නව මාතෘකා සපයනු ලැබ ඇත. මෙහි මූලික වෙනස්කම් වශයෙන් 376 - කාන්තා අධ්‍යාපනය 371.872ට ද, 377 - ආගමික පාසල් 371.07ට ද 370.19 - අධ්‍යාපනික සමාජ විද්‍යා 306.43ට ද යනාදීව කර ඇති නව ස්ථානගත කිරීම් දැක්විය හැකිය. වචනාවලිය ජාත්‍යන්තර භාවිතයටත්, ද්විතික අධ්‍යාපනය ආශ්‍රිතව කියවීම හා භාෂා කලාවේ ඇති වූ නව සංවර්ධනයන් මතුකර දැක්වීමටත් මින් උත්සාහ දරා ඇත.

560-590 දක්වා වූ ජෛව විද්‍යා වර්ග පංති ඩිවි 21 ට අදාළ වැදගත් සංශෝධනයකි. පූර්වයෙන් ජීවීන් අනුව බෙදා තිබූ වර්ග පංතිය ක්‍රියාකාරීත්වය (process) අනුව පෙළ ගැස්වීම මින් සිදු වී ඇත. 20 සංස්කරණයේ 574 ජීව විද්‍යා වර්ග පංතය 21 සංස්කරණයෙන් ඉවත් කර 570 ජෛව විද්‍යා යටතේ භාවිතයට යොදා ඇත. මෙය වාග් තලය අනුව විෂය සංකල්ප වඩාත් පෝෂිතව දක්වන අවස්ථාවක් ලෙස වැදගත් වේ. පූර්ව සංස්කරණයේ උද්භිද විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව විෂය යටතේ විසිරී ගිය විෂය සංකල්ප මෙහි 571 යටතේ එක්තැන් කර දක්වා ඇත. මෙය වර්ගීකරණයේ සහාය අනුක්‍රමය රැක ගැනීම පිළිබඳ ගුණාත්මක ලක්ෂණයක් ලෙස වැදගත් වේ. පොත් රාක්කගත කිරීමේ වර්ග ක්‍රමයක් ලෙස, කාලානුරූපව ඩිවි 21 ලබා ඇති සාර්ථකත්වය මින් පිළිබිඹු වේ.

## සමාන්තර අනුසූචි (Parallel Schedules)

21 සියවසට සාපේක්ෂ ව පරිගණිත වර්ගීකරණ රටාවෙන් මිදී නව මුඛාශිත ලක්ෂණ කරා ඩිවි දශම වර්ගීකරණය ගමන් ගැනීම මේ තුළින් විද්‍යාමාන වේ. මේ අනුව උපලේඛනයේ යම් ස්ථානයකට පමණක් සීමා වෙන අංක පාදක අංකයට එකතු කර විෂය විශ්ලේෂිත, සංස්ලේෂිත වර්ග අංකයක් ගොඩනගා ගැනීම කළ හැකිය.

නිදසුන් :- කලාව තුළ බුදු දහම - 704.948943

කලාව - ආගම - 704.9489

704.9489+කලාව තුළ ආගම් පාදක අංකයට 292-299 දක්වා ඇති අංක 29 ඉවත් කර එකතු කිරීම

704.9489+43 = 704.948943-කලාව තුළ බුදු දහම

## විශේෂිත අනු බෙදුම (Special Subdivisions)

මෙය ද නූතන විෂය විශ්ලේෂණ සංස්ලේෂණ ගුණාංගය ප්‍රකට කරවන්නකි. මෙමගින් යම් කිසි නියත වර්ගාංකයන්ට දක්වා ඇති විශේෂිත වක්‍රයකින් අංක එකතු කර අංකනයේ ප්‍රසාරණීයතාවය ගොඩ නගා ගත හැකි වේ.

352-354 රාජ්‍ය පරිපාලන වර්ග පංතියේ * (තරු) සළකුණින් දක්වා ඇති අංකවලට352-354 රාජ්‍ය පරිපාලන විශේෂ මාතෘකා වක්‍රයට අදාළ ව අංක එකතු කළ හැකි වේ.

නිදසුන් :- ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල අය වැය පාලනය පිළිබඳ මූලික ප්‍රකාශන - 352.48095493

## සහායක වක්‍ර (Tables)

ඩිවි 21 සංස්කරණයේ සහායක වක්‍ර හතකි. වත්මන් විෂය විශ්ලේෂණ, සංස්ලේෂණ අවශ්‍යතා පූර්ණනය සඳහා මින් ලැබෙන පිටුවහල ඉමහත් ය. ඒ අනුව පූර්ව සංස්කරණයේ පැවති 1, 2, 3, 5 සහ 6 සහායක වක්‍රවලට 21 සංස්කරණය මගින් නව වෙනස් කිරීම් සහ නව අංක එකතු කිරීම් කරනු ලැබ ඇත.

T 1 - ප්‍රමිත උප බෙදුම
T 2 - භූගෝලීය ප්‍රදේශ, ඓතිහාසික කාල වකවානු, පුද්ගලයන්
T 3 - විශේෂ සාහිත්‍ය රූපක සඳහා උප බෙදුම්
T 3A- ඒක කර්තෘක කෘති එක කර්තෘන් පිළිබඳ කෘති.
T 3B- බහු කර්තෘක කෘති සහ බහු කාර්තෘන් පිළිබඳ කෘති
T 3C- 3 B සහායක වගුවේ සූචි, 700.4.791.4 සහ 808-809. සහ උපදෙස් පරිදි කළ හැකි එකතු කිරීම
T 4 - ඒක භාෂාමය සහ පවුල් හි උප බෙදුම්
T 5 - වාර්ගික සහ ජාතික කණ්ඩායම
T 6 - භාෂා
T 7 - පුද්ගල කණ්ඩායම්

ඩිවි 21 සහාය වක්‍ර භාවිතයේ යම් යම් සාපේක්ෂ වෙනස්කම් ද වේ. මේ අනුව ප්‍රමිත උප බෙදුම් දැක්වෙන 01, 02, 03 යනාදී ව එන අංකවල 0 අංකය ඇතැම් අවස්ථාවල ඉවත් කිරීම අවම වී, 0 එකතු කිරීම අවස්ථාවෝචිත ව වැඩි වන තත්ත්වයක් දක්නට හැකිය.

නිදසුන් :- 610.3
330.03
620.003

විෂය ව්‍යාප්තියට සාපේක්ෂව සහාය වක්‍ර වර්ගාංක ගොඩනගා ගැනීමට දැරෙන උත්සාහය මින් විදහා දැක්වේ. මෙහි දී '0' විෂයක ස්වරූපීය ලක්ෂණ පෙන්නුම් කිරීමට සමගාමී ව විෂය ව්‍යාප්තිත්වය විදහා පෑමට '0' හෝ '00'හෝ '000' හෝ වශයෙන් එකතු කර දැක්විය හැකි බව පැහැදිලිය.

විෂය විශ්ලේෂණයට සහායක වක්‍ර දෙකක් එකතු කර දැක්වීමට, ඩිවි 21 සංස්කරණය මගින් සැලසෙන අවකාශය ද, 21 සියවසට එම වර්ග ක්‍රමයේ ඇති සාපේක්ෂ වැදගත්කම කියාපායි.

නිදසුන් :- ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන පර්යේෂණ
373.072095793

## භූගෝලීය වක්‍රය (02 වක්‍රය)

කාලීන ආර්ථික සමාජීය වෙනස්කම්වලට සාපේක්ෂව භූගෝලීය වෙනස්කම් නියෝජනයට භූගෝලීය වක්‍රයේ යම් යම් වෙනස් කිරීම් කරනු ලැබ ඇත. මේ අනුව 20 සංස්කරණයේ පැරණි සෝවියට් සමූහාණ්ඩුව සඳහා වූ 47 අංකය නව සංස්කරණයේ නැගෙනහිර යුරෝපය - රුසියාව යනුවෙන් දක්වා ඇත. බල්ගේරියාව සඳහා වූ - 4977 අංකය - 499 දක්වා ගෙන ගොස් ඇත. නෙල්සන් මැන්ඩෙලාගේ පාලනය නව අංකයකින් දක්වා ඇත. නෝර්වේ, ග්‍රීසිය, සයිප්‍රස්, ජෝර්දාන්, නයිජීරියා, හෙයිටි බ්‍රසීලය නවසීලන්තය යනාදී රටවල් සඳහා අංක ව්‍යාප්ත කිරීම සහ නැවත සැකසීම කරනු ලැබ ඇත. එම වෙනස්කිරීම් අදාළ රටවල ජාතික පුස්තකාල සහ ජාතික සංවිධානවල සහයෝගය මත සිදු කරනු ලැබ ඇත. ඉන් පැහැදිලි වනුයේ ද ජාතික අවශ්‍යතා පදනම් කරමින් නව ලෝකයට ගැළපෙන පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට, වර්ග ක්‍රමය දක්වන නම්‍යශීලී ස්වභාවය යි.

විෂයක භූගෝලීය ලක්ෂණ පැහැදිලිව සහ සම්පූර්ණයෙන් විදහා දැක්වීමට වර්ග ක්‍රමයෙන් සපයා ඇති අවකාශය ද මෙහිලා වැදගත් ලක්ෂණයකි.

නිදසුන් :-
එක්සත් රාජධානිය සහ ප්‍රංශය අතර ආර්ථික සම්බන්ධතා - 337.41044
අරාබි රටවලින් අප්‍රිකාවට කළ ජාත්‍යන්තර ආධාර- 338.9117406
(භූගෝලීය කලාප සම්බන්ධීකරණයට '0' සංයෝජක සංකේතය ලෙස භාවිතයට ගෙන ඇත.)

## විශේෂ සාහිත්‍ය රූපක උප බෙදුම් වක්‍රය (03 වක්‍රය)

සාහිත්‍ය විෂයෙහි මුඛාශිත ලක්ෂණ විශ්ලේෂණය කර වර්ග අංක ගොඩ නගා ගැනීමට මින් සුවිශේෂ සහායක් ලබා දී ඇත. මෙය වත්මන් විෂය විශ්ලේෂණ අවශ්‍යතා හා සාපේක්ෂව බලන විට වර්ග ක්‍රමයේ සාර්ථක කඩ ඉමකි.

නිදසුන් :-
හින්දි පද්‍යවලින් නිරූපිත කාශ්මීරය -
891.431093254913
891.43 - හින්දි සාහිත්‍ය (උපලේඛනය)
1 - පද්‍ය (සහායක වක්‍ර - T 3)
09 - විචාර (සහායක වක්‍ර T 3 C)
32 - ස්ථානය (රට) (සහායක වක්‍ර -T 2)
(T 3 C හි 32 ස්ථාන යටතේ උපදෙස් දී ඇති පරිදි)

උක්ත වර්ගාංකයෙන්,

- විෂය
- ස්වරූපය
- ස්ථානය

යනාදීව දැක්වෙන විෂය මුඛවලින් නිරූපිත වනුයේ වර්ග ක්‍රමයෙන් විෂය විශ්ලේෂණයෙහි ලා දක්වන ප්‍රවණතාවයයි.

## වාර්ගික , ජාතික සහ ජාතිකත්ව වගුව (05 වගුව)

21 සියවසේ අවශ්‍යතා හා ගැළපෙන පරිදි මෙම වගුවේ ද ඇතැම් අංක නැවත සැකසීම සහ නව අංක එකතු කිරීම කර ඇත.

නිදසුන් :-

-9157 - ටාජික් (Tajik) (පූර්ව සංස්කරණයේ - 9159)

-5159 - අනෙකුත් ඉරානීය ජනතාව (මෙහි Kurds සහ Baluchi ජනයා සඳහා නව උප බෙදුම් දක්වා ඇත.)

-9594 - Miao සහ Yao ජනතාව සඳහා නව අංකය

## භාෂා වගුව (06 වගුව)

මෙය ද නව වෙනස්කම්, ස්ථානගත කිරීම්, ව්‍යාප්ත කිරීම් කරනු ලැබ ඇති වගුවකි.

නිදසුන් :-

391 - යේඩිසි

943 - ටර්කි භාෂා

963 - නයිගර්, කොන්ගෝ භාෂා

97 - උතුරු ඇමරිකා ස්වභාෂා

## යුක්ති භාවිතය (Divices)

නූතන මුඛාශිත වර්ග ක්‍රම හා ප්‍රකට ලක්ෂණයක් වනුයේ, විෂය විශ්ලේෂණය සඳහා විවිධාකාර යුක්ති භාවිතයයි. මේ අනුව කාලීන විෂය විශ්ලේෂණ අවශ්‍යතා මත ඩිවි දශම වර්ග ක්‍රමයේ ද විවිධ යුක්ති භාවිත වේ. හිඩැස් යුක්තිය ආකාරාදී යුක්තිය දශම යුක්තිය විෂය යුක්තිය යනාදී යුක්ති මෙහි දී ප්‍රධාන වේ.

## විෂය යුක්තිය (Subject Devices)

විෂයයක් තවත් විෂයක අනු විෂයක් ලෙස බිහිවීමේ දී එය විශ්ලේෂණය සඳහා 000-999 දක්වා එකතු කරන්න. උපදේශනය යටතේ වර්ග කිරීම මේ යටතේ සිදු වේ.

නිදසුන් :-

නීති පුස්තකාල වර්ගීකරණය
025.4643
025.46 ට000-999 දක්වා අංක එකතු කරන්න.

ලසු ලේඛනයේ නියුතු ශ්‍රම බලකාය.
331.11916513741
331.1191 ට 000-999 දක්වා අංක එකතු කරන්න.

## විෂයාන්තර සබඳතා විශ්ලේෂණය (Inter - Subject Relation)

විෂයාන්තර සබඳතා පැවතීම නූතන විෂය සංකල්ප බිහිවීම තුළ ප්‍රකට ලක්ෂණයකි. පූර්ව සංස්කරණ මගින් හඳුන්වා දී ඇති මෙම ලක්ෂණය 21 සංස්කරණය මගින් සුනම්‍ය ලෙස වර්ධනය කර ඇත.

නිදසුන් :-

පුස්තකාලයාධිපතිවරු සඳහා කළමනාකරණය - 658.002402

## අන්තර් විෂය මුඛ සබඳතා විශ්ලේෂණය (Inter - Facet Relation)

මුඛ සබඳතා විශ්ලේෂණයේ දී මෙය වැදගත් ය. මෙහි දී '0' එකතු කිරීම මගින් විෂයක භූගෝලීය ලක්ෂණ මනාව විශ්ලේෂණය කර දැක්විය හැකිය.

නිදසුන් :-

බ්‍රසීලය සහ අරාබි ලෝකය අතර විදේශ සම්බන්ධතා 327.810174927

එක්සත් රාජධානිය සහ ප්‍රංශය අතර අන්තර්ජාතික ආර්ථික සම්බන්ධතා - 337.41044

## සාපේක්ෂ අනුක්‍රමණිකාව (Relative Index)

21 සංස්කරණය මගින් 20 සංස්කරණයට වඩා සංවර්ධනාත්මක ව සංලේඛ වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කරනු ලැබ ඇත. තෝරාගත් ගොඩ නැගූ වර්ග අංක සඳහා සංලේඛ, ජාත්‍යන්තර භාවිතයට උචිත සංලේඛ වචනාවලි පද සහ අත්පොත සටහන් සඳහා අනුක්‍රමණිකා පද මේ සමග ඉදිරිපත් කරනු ලැබ ඇත. බොහෝ විෂයාන්තර අංක උපලේඛනය සහ සාපේක්ෂ අනුක්‍රමණිකාව තුළින් හඳුන්වා දෙනු ලබයි. මින් විෂයක ඕනෑම ශික්ෂණයක් එක් ශීර්ෂයක් යටතට ගෙන විෂයක විවිධ දෘෂ්ටිකෝණ අනුව අර්ථ විග්‍රහ කරමින් අංක සපයනු ලබයි. එය විෂයකට ඕනෑම දෘෂ්ටිකෝණයක් යටතේ අංක ගොඩ නැගීමට පහසුකම් සලසයි. මෙය දැනුම් විප්ලවයකට යොමු වී සිටින 21 සියවසේ දැනුම් වර්ගීකරණයට නොමඳ සහායකි.

## අත්පොත (Manual)

21 සංස්කරණයේ 4 වන වෙළුමට අදාළ මෙය පූර්ව සංස්කරණවලට වඩා විශාලය. සෑම අත් පොත් සටහනක් ම වඩා ප්‍රිය මනාප හෝ සැක සහිත අංක සමග ස්ථානගත

කර ඇත. තත්කාලීන අවශ්‍යතා හා සාපේක්ෂ තුන් ආකාරයකින් සටහන් දක්වා ඇත.

1. එක අංකයට වඩා පොදු ප්‍රශ්න සඳහා සටහන් (හෝ - සහ සමග බැඳුන අංක)
   නිදසුන් :- 583-585 හෝ 380.1 සහ 381.382
2. එක අංකයක් පමණක් වූ ප්‍රශ්න සඳහා සටහන් (තනි අංක හෝ එහි උප බෙදුම්)
3. විවිධ අංක සඳහා සටහන්

වර්ගීකරණයට උපදෙස් දීම, ඥාති විෂය සබඳතා ඇති අංක අතර අවශ්‍ය අංකය තෝරා ගැනීමට උපදෙස් දීම, වර්ගාංක දෙකක් සමානාර්ථ දක්වන විට ඒ අතර සන්සන්දනය දැක්වීම අත්පොත මගින් සිදුවන හෙයින් වර්ගීකරණය පහසුවෙන් සහ නිරවුල් ව කිරීමට හැකියාව ලැබී ඇත. මේ අනුව 21 සියවසේ දැනුම් වර්ගීකරණයට අත්පොත මගින් ද සුවිශේෂ සහායක් ලැබෙන බව පැහැදිලිය.

## ඩිවි පරිගණක මාධ්‍ය පිටපත (Dewey for Windows - CD ROM)

මෙය ඩිවි දශම වර්ගීකරණය - 21 සියවසට සාපේක්ෂව වැදගත් වීම පිළිබඳ පැහැදිලි සංනිදර්ශකයකි. මෙතෙක් අත්හුරු මාධ්‍යයෙන් කරන ලද වර්ගීකරණය නූතන තාක්ෂණවේද හා අනුගත ව පරිගණකානුසාරයෙන් කිරීමට මින් අවකාශ සලසනු ලැබ ඇත.

ඩිවි දශම ක්‍රමයේ සංස්කරණ විකාශය සහ 21 සංස්කරණය පිළිබඳ උක්ත තොරතුරු සමස්තයක් ලෙස ගත්විට පැහැදිලි වනුයේ විශ්ව ඥානයේ තත්කාලීන දැනුම, දැනුම් සංවිධානය සහ තාක්ෂණික වර්ධනයට සමානුපාතික ව ඩිවි වර්ග ක්‍රමයේ සාපේක්ෂ වෙනස්කම් සිදුවෙමින් පවත්නා බවයි. එසේ ම ප්‍රායෝගික වර්ග ක්‍රමයක් ලෙස පරිණාමයට ඩිවි ක්‍රමයට ඇති හැකියාව එහි සජීවී අඛණ්ඩ පැවැත්මට හේතු වී ඇති බවයි.

මේ අතර ඩිවි ක්‍රමයට ආවේණික දුර්වලතා නැතිව ද නොවේ. ඩිවි පදනම් ව්‍යුහයේ පවත්නා සීමා සහිතකම් ඊට බලපානු ලැබ ඇත. ඒ අනුව විෂය සංකල්ප දෙකක් එක විට ප්‍රකාශනය ගැටලු සහගත වේ.

යුක්ති භාවිතය සඳහා ලැබී ඇති සීමිත පරාසය තුළ විෂය විශ්ලේෂණය සහ ප්‍රසාරණීයතාව රැක ගැනීම නොවිසඳුණු ගැටලුවක් ව ඇත. 200 - ආගම 300 - සමාජීය විද්‍යා 900- ඉතිහාසය, භූගෝලය යන ප්‍රධාන වර්ග පංති විෂමතා සහිත වර්ග ලෙස විවාදිත ව ඇත.

ඩිවි ක්‍රමයට ආවේණික මෙබඳු දුර්වලතා සහගත පසුබිම තුළ වුව ද විශේෂත්වය වනුයේ ගැටලු විසඳා ගනිමින් එය අඛණ්ඩව පවත්වා ගෙන යාමට දරන අනවරත උත්සාහයයි. වෙනත් වර්ග ක්‍රම හා සන්සන්දනයේ දී සුවිශේෂත්වය වනුයේ ඒවායේ කර්තෘන් මිය ගිය විට එම වර්ග ක්‍රමය ද අභාවිත වී ඇති බවයි. එහෙත් ඩිවි දශම ක්‍රමය එහි කර්තෘ වන මෙල්විල් ඩිවි 1931 දී මිය ගිය ද තව දුරටත් ජනප්‍රිය භාවිතයේ පවතී. මේ අනුව උක්ත සමස්ත තොරතුරුවලින් ප්‍රකට වනුයේ 21 සියවසට ඩිවි දශම ක්‍රමයේ ඇති සාපේක්ෂ වැදගත් බවයි.

### ආශ්‍රිත ග්‍රන්ථ :


1. Dewey Decimal Classification and Relative Index : 20th ed. 1989
2. Dewey Decimal Classification and Relative Index : 21th ed. 1996
3. Sharma, Pandey S K Practical Approach to DDC. New Delhi : ESS ESS. 1998
4. තිලකබන්දු එච්. ඩිවි දශම වර්ගීකරණයේ 20 වන සංස්කරණය සහ ප්‍රවනතා පුස්තකාල විද්‍යාව සද්ධර්මාකර ශාස්ත්‍රීය ලිපි සරණිය 1994. පි. 124- 135.



සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරන පුවත්පත්වල ලිපි සොයා ගැනීමට පහසු ප්‍රවේශයක්

ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව

වාර්ෂික ප්‍රකාශනයකි

කලාපයක මිළ රු.100/-

විමසීම් :

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
14, නිදහස් මාවත,
කොළඹ 07.

# Library & Information Education of Sri Lanka in comparison with those of other South Asian countries

Pradeepa Wijetunga
Director
National Institute of Library and Information Science

## 1. Introduction

This paper discusses initially the historical beginnings of LIS education in four South Asian countries. Secondly it discusses the current status of LIS programs paying special attention to different levels of courses and entry requirements. Thirdly it discusses the curriculum contents with an emphasis on core contents and specialisation within the courses. Relevance and reference to indigenous libraries, teaching faculty, research and publications, national level planning are discussed next and finally a conclusion is given.

### 1.1 History of LIS Education in South Asia

Libraries have been in existence in South Asia for thousands of years although very little research has been carried out on these indigenous libraries. The library in its modem sense is a recent development. After gaining independence in the latter part of 1940, there was a considerable growth in the number of libraries in the South Asian region. Several authors have mentioned that there was a dearth of professionally qualified personnel to organise libraries on systematic and proper lines. (Bansal & Tikku, 1988), (Ahmad, 1988), (Khurshid 1977), (Kandiah 1958).

History of LIS education in South Asia can be traced back to the library training classes held in Baroda and Lahore in 1911 and 1916. Dr. S.R. Ranganathan started first systematic teaching in India in 1928 with a certificate course under the auspices of Madras Library Association. This course was taken over by the University of Madras in 1931 and made into a postgraduate diploma in 1937. Andra University (1935), Banaras Hindu University (1941), Bombay University (44943), Calcutta University (1945), and Delhi University (1947) commenced postgraduate diploma courses. Delhi University started a M.Lib.Sc. course in 1948 followed by Banaras Hindu University (1965), Bombay University (1968), and Karnataka, Mysore and Vikram Universities in 1971. A Ph.D. programme was started in the Delhi University in 1950. Besides these courses, India started training information personnel at the Documentation Research and Training Centre (DRTC established in 1962) and Indian National Scientific Documentation Centre (INSDOC established in 1952). Apart from these, a certificate course was started at Aligarh Muslim University in 1951. Delhi Library Association and four other state associations conducted certificate courses.

According to Khurshid (1987) Pakistan started its LIS training programmes with a certificate course in 1915 at the University of Punjab, Lahore, but suspended in 1917 and in 1947, at the time of establishment of Pakistan. It was restarted in 1950 as a graduate program. In 1956, a new postgraduate diploma course was started in the University of Karachi. In 1962 the same university started a degree program leading to MA in library Science. Ph.D. programme was initiated in 1967 and M.Phil. in 1985. Nomenclature of diploma and degree were changed to diploma in Library and Information Science and Masters in Library and Information Science respectively in 1982 and 1983. University of Punjab, the oldest library school in the sub continent upgraded its certificate course to diploma level in 1959 and introduced an MA course in 1974 and M.Phil. in 1987. University of Peshawar started a one-year postgraduate diploma in 1962 and MA

in 1963. Islamia University of Bahwalpur started a one year diploma in 1984, a Masters Degree in 1984 and enrolled a doctoral candidate in 1986. The University of Baluchistan established a diploma in 1981 and MA in 1984.

Bangladesh emerged as an independent country in 1971 and library education was practically non-existent except at the University of Punjab, Lahore. In 1952 the first three months certificate course was instituted at the University of Dhaka. This is the first attempt at formal library training in the East Pakistan, now Bangladesh. From 1955 to 1958 American teachers conducted four short courses. In 1958 East Pakistan Library Association (now Bangladesh Library Association) sponsored the first full-fledged training course in Librarianship. The completion of the courses convinced the university authority and ultimately led to the introduction of one-year diploma in 1959 at the Dhaka University. This was subsequently elevated to Masters level in 1962 and M.Phil. in 1976 and Doctorate in 1979. In 1963 National Institute of Educational Administration Extension and Research (NIEAER) started training school librarians and similar courses were started from 1975 by four teacher training colleges. Bangladesh Library Council organised a 6-month certificate course in 1972.

History of library education in Sri Lanka is not discussed in detailed here because several other authors have discussed this in previous documents.

## 2. Current Status of LIS Education in South Asia

A sample of institutions in the four South Asian countries, where LIS education exists, was approached to obtain course documentation. Response from India was rather poor compared to Pakistan and Bangladesh. Sri Lankan response rate was 100%.

### 2.1 Current Status of Courses Available in South Asia

Table 1 - Different types of courses available in South Asia

| Course \ Country | India | Pakistan | Bangladesh | Sri Lanka |
|---|---|---|---|---|
| Certificate | LAs, Colleges, Universities | - | NIEAER | University |
| Diploma | Polytechnics, LAs, Universities | - | - | LA |
| As a module in an undergraduate program | Universities, Colleges | - | - | National Institute of Education |
| Bachelors (one year) | Universities | Universities | - | - |
| Bachelors (3-4 years) | - | - | Universities | Universities |
| PG Diploma | - | Universities | Universities | - |
| Masters (One year) | Universities | Universities | - | - |
| Masters (Two years) | - | - | Universities | Universities |
| M.Phil | Universities | Universities | Universities | - |
| Ph.D. | Universities | Universities | Universities | - |

82720

Current LIS courses in India range from certificate to Ph.D. level. Certificate, degree, and postgraduate qualifications are popular and conducted by more than one kind of institution. There are five levels of LIS education programmes in Pakistan ranging from elective at Bachelors level to Ph.D. level. In Bangladesh, it varies from one-year diploma to Ph.D. level at universities. In addition, there are two, certificate courses aiming to train school librarians. LIS education programmes in Sri Lanka range from a module in B.Ed. programme through certificate level to two year Masters program. Higher academic qualifications are not available. In the other three countries, universities seem to play a major role in LIS education, training more professionals at university level. In Sri Lanka more students are trained at certificate level by the SLLA and DLIS while universities play a major role in training a few at higher level. None of these courses, in any South Asian country are accredited by any organisation.

## 2.2 Entry Requirement and Duration

**Table 2 Minimum Entry Requirement and Duration**

| Course | Duration | Minimum entry requirements in each country | | | |
|---|---|---|---|---|---|
| | | India | Pakistan | Bangladesh | Sri Lanka |
| Three tier part-time | Appr. Three calendar years | - | - | - | GCE/OL 6 psses with credits for numeracy and English AND 3 yrs. experience to enter first year and a pass in second level to enter third year |
| Bachelors | One year | 2$^{nd}$ division Bachelors (sometimes a good Masters in another discipline) | A good Bachelors in another discipline | - | - |
| Bachelors | Three/Four years | - | A good Bachelors | HSC with at least two 2$^{nd}$ divisions | GCE/AL qualifications as required for other university courses. |
| Associateship in Information Science | Two years | Bachelors in LIS or a 2$^{nd}$ division Masters in another subject OR Bachelors in Medicine of Engineering | - | - | - |
| Postgraduate Diploma | One year | - | A good Bachelors | 2$^{nd}$ division Bachelors in LIS | - |
| Masters | One year | A good Bachelors in LIS, Admission test and 1-2 years experience | PG Diploma or Bachelors in LIS | - | General/Special Degree in LIS OR General/Special Degree and 1 year experience in a recognised library OR General/Special Degree and Advanced Certificate of University of Kelaniya or final year exam of SLLA |
| Masters | Two years | - | - | 2$^{nd}$ division Bachelors in LIS | 1$^{st}$ or 2$^{nd}$ class honours in special/general degree in any subject OR Bachelors with Postgraduate degree/ Diploma any field of study OR Bachelors with SLLA or equivalent in LIS AND 1 year work experience in a recognised library AND a good working knowledge of English |

| | | | | | |
|---|---|---|---|---|---|
| M.Phil | Two years | Academic merit and Masters in LIS | A good Masters in LIS | A good Masters in in LIS | - |
| Ph.D | Two-Five years | Academic merit and Masters in LIS | A good MLIS / MA / M.Phil | M.Phil/Masters with 2 years teaching experience and publications | - |

Entry requirements are less stringent in Sri Lanka when compared to those of other South Asian countries. To gain admission to Bachelors in LIS, India and Pakistan demand a good Bachelors degree in another discipline, but according to Mangla (1994) most Indian library schools consider candidates with a good masters degree in another discipline for admission to bachelors degree. Sri Lankan and Bangladeshi student need only GCE/AL qualifications to gain admission to Bachelors in LIS. However, in these two countries Bachelors in LIS is a 3-4 year course while in India and Pakistan it is only a one-year programme. We can assume that, although the duration is of one year Indian and Pakistani LIS bachelors students are more mature than the Sri Lankan and Bangladeshi LIS undergraduate because they are mature students with prior university training. However, Indian UGC recommends that an admission test and an interview should become the criteria for selection, so that those with best academic qualifications as well as best personal qualities are selected.

Entry requirements for masters degree in Sri Lanka is a good Bachelors degree in LIS or any other discipline plus one year work experience in a recognised library. In other South Asian countries a LIS qualification (usually Bachelors) is essential for this.

Although the duration of Sri Lankan Masters degree is of two years, only the first year (300 hours) is devoted to theoretical study. Second year is completely devoted to the research and writing up of dissertation of 30,000 - 40,000 words.

Masters degree being the highest academic qualification available in Sri Lanka for managerial level professionals as well as LIS educators therefore can produce professionals with only one year of formal training in LIS. Quality of pre-course experience and the amount of research undertaken for the dissertation can vary widely according to the personal qualities, place of work, academic capabilities of the student.

## 2.3 Course Content

**Table 3 Course contents of certificate level**

| Bangladesh | Sri Lanka |
|---|---|
| Library organisation and administration | Introduction to librarianship & information services |
| Classification | Classification |
| Cataloguing | Cataloguing |
| Book selection | Library and information services |
| Bibliography | Information technology |
| Reference and PR | Indexing |
| | Management |
| | Research methods |
| | Technical services |
| | Reprography, printing and publishing |

* Contents of certificate level courses of India and Pakistan were not available.

Table 4 Course contents of Teachers Training Colleges

| Bangladesh (2-4 weeks and 10 months courses) Information | Sri Lanka ( Education Technology & Science module of NIE) |
|---|---|
| Library history | Use of library resources-reference tools, methods of organising knowledge. |
| Cataloguing and classification | Information sources - types of libraries, services, introduction to students, developing attitudes of skills |
| Types of libraries | School library service - objectives, role and function, acquisitions and organisation of knowledge, observation and evaluation of reader services, attitudes towards resource sharing. |
| School Library | |
| Technical services & reader services | |
| Preservation | |
| School library finance | |
| Teaching the use of books and other library material | |

Table 5 Course contents of Bachelor of Library Science/Bachelor of Library and Information Science

| India | Pakistan | Bangladesh | Sri Lanka |
|---|---|---|---|
| Cataloguing theory | Cataloguing theory | Cataloguing theory | Cataloguing theory |
| Cataloguing practicals | Cataloguing practicals | Cataloguing practicals | Cataloguing practicals |
| Classification theory | Classification theory | Classification theory | Classification theory |
| Classification practicals | Classification practicals | Classification practicals | Classification practicals |
| | | | Documentation Services |
| Library Management | Library Administration & Management | Library Management & Administration | Library Management |
| Reference services & bibliographic sources | Introduction to library resources & material | Basic principles of sociology | Technical services |
| Information sources & services | Bibliographic control & organisation | Collection building, indexing, abstracting | Reader services |
| Library & society | Library collection development | Books, library & society | Library & society |
| Application of IT in libraries | | | Computer applications in libraries |
| | | | Archival science |
| | | | Technical English |

## Table 6 Course contents of Master of Library Science/Master of Library and Information Science

| India | Pakistan | Bangladesh | Sri Lanka |
|---|---|---|---|
| Management of libraries & Information centres | | Library Administration & Organisation | Library Management |
| Advanced Classification | | Cataloguing Theory | Bibliographic Control |
| Advanced Cataloguing | | Cataloguing Practicals | |
| | | Classification Theory | |
| | | Classification Practicals | |
| | | Advanced Classification Theory | |
| | | Advanced Classification Practicals | |
| | | Advanced Cataloguing Theory | |
| | | Advanced Cataloguing Theory | |
| Information Sources, Systems, Programs | Library Resources | Library Systems & Services | Information Sources & Services |
| Research Methods | Research Methods | Research Methods | Research Methods |
| Application of IT | | Bibliography & Reference | Electives (Information Technology, Data Communication |
| | | | Collection Management) |
| Information Retrieval | | Abstracting & Indexing | |

to be continued

පුස්තකාල සඳහා ලිපි ද්‍රව්‍ය සහ උපකරණ

ලිපි ද්‍රව්‍ය :
පාඨක බලපත්‍ර
සූචි පත්‍රිකා
පොත් තුණ්ඩු
දින පත්‍රිකා
පොත් සාක්කු
නියමු ලේබල්
පරිග්‍රහණ ලේඛන (පිටු 150)
පරිග්‍රහණ ලේඛන (පිටු 300)
සාමාජික අයදුම් පත් (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)

ජාතික පුස්තකාල පොත් හල
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන
සේවා මණ්ඩලය
අංක 14,නිදහස් මාවත
කොළඹ 07.



උතුරු හා නැගෙනහිර පළාතේ සිංහල/දෙමළ පාසල්
පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීමේ පාඨමාලාව - ත්‍රිකුණාමලය,
வடகிழக்கு மாகாண சிங்கள/தமிழ் பாடசாலை
நூலகர்களை பயிற்றுவிக்கும் பாடநெறி -
திருகோணமலை
Training programme for School Librarians in North and East Province, Trincomalee 07.03.2002



නව පුස්තකාල ගොඩනැගිල්ල - මහනුවර මහජන පුස්තකාලය
புதிய நூலகக் கட்டிடம் - பொது நூலகம் - கண்டி
New Library Building - Public Library, Kandy
19.01.2002

# National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/11
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..........

Date : 2017/10/11

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*